# සාරාංශය

# සමාජ-දේශපාලන යථාර්ථයන්

## පුද්ගල ආලම්භන නීති සම්පාදන

# භුක්තිය අත්පත්කර ගැනීමේ නීතිය

***Amazon Books –*** [*'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'*]

**http://www.consultants21.com/page-1-public-interest-litigations.php**

## *+ 2012 දී ශ්‍රී ලංකාවේ අගවිනිසුරුවරිය දෝෂාභියෝගයට ලක් කිරීම සඳහා සහයෝගය දැක්වීම යුක්ති සහගත වීම*




*විශාලත්වය "8.25 -X 11" - පිටු ගණන 818*

මෙම ග්‍රන්ථය කර්තෘ විසින් කොටස් දෙකකින් සමන්විතව ඉදිරිපත් කරනු ලබයි. පළමුවන කොටස වන්නේ, ජපානය වැනි ප්‍රබල රටක් විසින් කුඩා රටක් වූ ශ්‍රී ලංකා රජය වෙත, පිළිගත් ජපන් සමාගම් විසින් කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමේදී කල වංචාව යටපත් කිරීම සඳහා, ජපන් රජය විසින් අනිසි රාජ්‍ය පීඩන ක්‍රියාත්මක කරන ලද ආකාරය පදනම් කර ගනිමින්, දේශපාලන සහ රාජ්‍යතාන්ත්‍රික දෙබිඩි පිළිවෙත සහ යථාර්ථය හෙළිදරව් කිරීමකි. මෙය සවිස්තරාත්මකව වෙනම සාරාංශයක් ලෙස පල කොට ඇත.

මෙහි දැක්වෙන්නේ එහි දෙවන කොටස වන, රජය විසින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් 2011 අංක 43 දරණ 'ඌණ ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌණ උපයෝජිත වත්කම් පුනරුදය' කිරීමේ පනත ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හිතුවක්කාර විශේෂ නිශ්චය මත, කඩිමුඩියේ *'පුද්ගල ආලම්භන නීති සම්පාදන - භුක්තිය අත්පත්කර ගැනීමේ නීතියක්'* ලෙස හදිසි කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීම

සම්බන්ධයෙන් කර්තෘ විසින් කරුණු සහ ක්‍රියාදාමයන් පදනම් කර ගනිමින්, එවැනි පනතක් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට අනනුකූලව නිශ්චය විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම සඳහන්ව තිබීමෙන්, එමගින් ශ්‍රේෂ්ඨාධිකරණය බල රහිතව සිටියත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සිදු කල විශේෂ නිශ්චය මගින් ව්‍යවස්ථාවට අනුකූල යයි නිගමනය කිරීමෙන්, ශ්‍රේෂ්ඨාධිකරණයේ දෙබිඩි පිළිවෙත සහ යථාර්ථය මැනවින් පෙන්නුම් කිරීමකි.

කර්තෘ විසින් මනාව සහ සත්‍ය වශයෙන්ම සනාථ කර ඇත්තේ, '*භුක්තිය අත්පත්කර ගැනීමේ නීතියක්'* ලෙස හැඳින්වෙන 2011 අංක 43 දරණ 'ඌණ ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌණ උපයෝජිත වත්කම් පුනරුදය' කිරීමේ පනත් කෙටුම්පත, හොර රහසේ "හදිසි පනත් කෙටුම්පතක්" ලෙස ශ්‍රී ලංකා අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කර ඇති අතර, ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් එම කෙටුම්පතේ ව්‍යවස්ථානුකූල භාවය පිළිබඳ විශේෂ නිශ්චය සිදු කිරීම සඳහා 2011.10.20 බ්‍රහස්පතින්දා දින ශ්‍රී ලංකා අගවිනිසුරුවරියට ඉදිරිපත් කරන ලදුව, 2011.10.21 සිකුරාදා දින ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරය වෙත එය ලැබී ඇති අතර, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ එය විමසීමට සති අන්තයක් තිබියදී, 2011.10.24 වන සඳුදා දින එම පනත් කෙටුම්පත විමසීමට ලැයිස්තු ගත කර තිබීමය.! - *එනම්:*



ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

My No. CSA/7/UB/2/2011

October 20, 2011

**Hon Chief Justice**
Chief Justice's Chambers
Supreme Court
Colombo 12.

My dear Chief Justice,

The Cabinet of Ministers has decided that, in its view, the Bill titled "An Act to provide for the vesting in the Government Identified Underperforming Enterprises and Underutilized Assets" is urgent in the national interest in terms of Article 122 (1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

I forward herewith 08 copies of the Bill bearing an endorsement to that effect under the hand of the Secretary to the Cabinet for the special determination of the Supreme Court under Article 122 (1) (b) as to whether the bill or any provision thereof is inconsistent with the Constitution.

Yours sincerely,

MAHINDA RAJAPAKSA

Democratic Socialist Republic of Sri Lanka



February 1998 authenticated by M. A. K. Mallawarachchi, Superintendent of Surveys of Gampaha on behalf of the Surveyor General of the land called Yakadawala Mukalana vested in the Board of Investment of Sri Lanka situated at Matalana Village within the Pradeshiya Sabhawa Limits of Attanagalla in the Udugaha Pattu of Siyane Korale in the District of Gampaha Western Province and which said allotment of land marked Lot 27 is bounded on the NORTH by the balance portion of Lot 5 in State Preliminary Plan No. 2776 and Lot 28 in Plan No. 599 by A. S. C. Vitanage, Licensed Surveyor; EAST by Lot 28 in Plan No. 500, Lot 1 in Plan No. 494 and Lot 26 in Plan No. 493 by A. S. C. Vitanage, Licensed Surveyor; SOUTH by Lot 26 in Plan No. 493 by A. S. C. Vitanage, Licensed Surveyor and the balance portion of Lot 5 in State Preliminary Plan No. 2776 and on the WEST by the balance portion of Lot 5 in State Preliminary Plan No. 2776 and containing in extent Three Acres and Sixteen Perches (A3-R0-P16) or One decimal Two Five Four Five Hectares (1.2545 Hec.) as per the aforesaid Plan No. 950.

**ENDORSEMENT UNDER ARTICLE 122 OF THE CONSTITUTION**

It is hereby certified that in view of the Cabinet of Ministers the above Bill is urgent in the national interest.

Sumith Abeysinghe
Secretary to the Cabinet of Ministers

**SUMITH ABEYSINGHE,**
Secretary to the Cabinet.

Date; October 20 2011.

21

**CERTIFIED TRUE COPY**

දැන දැනම එහි අවශ්‍යතා ඇති පුද්ගල ආලම්භන නීති මගින් ඍජුවම බලපා ඇති පක්ෂ වෙත කිසිදු අයුරක දැනුම් දීමක් සිදු නොකරමින්, එමගින් ඔවුන්ගේ ස්වභාවික යුක්තිය සහ ව්‍යවස්ථාපිතමය අයිතීන් වලක්වා ඇත. තවද මෙම පනත් කෙටුම්පත ව්‍යවස්ථාවට අනනුකූලව නිශ්චය විය යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පනත් කෙටුම්පත යොමු කල අවස්ථාවේ එයට අභියෝග කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට පවතින ව්‍යවස්ථානුකූල අයිතියද වළක්වාලමින්, මෙම කෙටුම්පත පිළිබඳ විමසීම 2011.10.21 සිකුරාදා දින ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ලැබුණු පසු, සති අන්තයේ කඩිමුඩියේ හා හොර රහසේම අදාල කටයුතු සිදු කර, 2011.10.24 වන සඳුදා දිනම එය විමසීමට ලැයිස්තු ගත කර තිබුණි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලකින් සමන්විත වූ අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක විසින් මූලසුන දැරූ සහ විනිසුරුවරුන් වූ පී. ඒ. රත්නායක, චන්ද්‍රා ඒකනායක විසින්, නොතිසි යවා තිබූ ගරු නීතිපති වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල්වරයා ඉදිරියේ පමණක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ නිශ්චය සිදු කර තිබුණි.! ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු මඩුල්ල විසින් පැන නැගූ නොයෙකුත් 'සැකයන්' මත වූ ප්‍රශ්න වලට නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල්වරයා විසින් පැහැදිලි කිරීම් සිදු කර ඇත.

'හදිසි කෙටුම්පතක්' විමසීමේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ සම්බන්ධිත 'සැකයන්' මතු කලහොත්, එමගින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123 (3) වගන්තිය අනුව, එම කෙටුම්පත ව්‍යවස්ථාවට අනනුකූල වේ යයි නිගමනය වීමෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය බල රහිත වේ. එනමුත්, මෙහිදී ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින්, එම පනත් කෙටුම්පත ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට අනුකූලයයි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විශේෂ නිශ්චය කිරීමක් සිදු කර ඇත. (අවධාරණය කර ඇත.)-එනම්:

> 123. (3) 122 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි සටහනක් කරන ලද පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් වූ විට, ඒ පනත් කෙටුම්පත හෝ පනත් කෙටුම්පතේ යම් විධිවිධානයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල ද යන සැකයක් ශ්‍රේෂ්ඨාධිකරණය පළ කලහොත් ඒ පනත් කෙටුම්පත හෝ පනත් කෙටුම්පතේ එම විධිවිධානය හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල යයි තීරණය කරනු ලැබුවාක් සේ සලකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මේ ව්‍යවස්ථාවේ (1) වන සහ (2) වන අනුව්‍යවස්ථාවල විධිවිධාන අනුව ක්‍රියා කළ යුත්තේ ය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, එම පනත් කෙටුම්පත 2011.11.8 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝග පත්‍රයට ඇතුලත් කර ඇති අතර, ඊළඟ දවසේදීම එනම් 2011.11.9 දින කඩිනමින් විවාදයට ගෙන සහ පාර්ලිමේන්තුවේ කථානායකවරයා වූ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සොහොයුරු චමල් රාජපක්ෂ විසින් ඉතාමත් කඩිසරව 2011.11.11 දින එම පනත නීතියක් බවට සහතික කර තිබුණි. එනමුත්, එම සහතික කිරීමේ නිවේදනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණේ 2011.11.22 වන දිනදීය. - *එනම්:*

**පාර්ලිමේන්තුව**

பாராளுமன்றம்

PARLIAMENT

***2011 නොවැම්බර් 22 වන අඟහරුවාදා***

*2011 நவம்பர் 22, செவ்வாய்க்கிழமை*

*Tuesday, 22nd November, 2011*

***පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***

*பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 9.30 a.m., MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.*

**නිවේදන**

அறிவிப்புக்கள்

ANNOUNCEMENTS

**I**

**කථානායකතුමාගේ සහතිකය**

*சபாநாயகரது சான்றுரை*

SPEAKER'S CERTIFICATE

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව, 2011 නොවැම්බර් මස 11 වන දින මවිසින් "ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

මෙම ඉහතින් සඳහන් අදමා්‍ය පනත මගින්, අනෙකුත් ඉඩම් 77 ක් සමඟ කොළඹ හිල්ටන් හෝටලය හිමි සමාගම වූ හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගම ශ්‍රී ලංකා රජය වෙත පවරා ගැනීමට නියමිත වූ එකම සමාගම ලෙස උපලේඛන ගත විය.




එවැනි තත්කාර්ය අත්පත් කර ගැනීමට පැහැදිලි හේතු ලෙස දක්වා ඇත්තේ, රජය විසින් රු. මිලියන 12,000 ක ණයක් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගමට නැවත ගෙවීමේ පදනම වූ අතර, එසේ දැක්වූයේ මේ වන විටත් ඒ සඳහා වසර 2 ක කාලයක් 2011.5.10 දිනැති ලිපියක් මගින් භාණ්ඩාගාරය ලබා දී තිබූ අතරය. මෙම රු. මිලියන 12,000 සත්‍ය වශයෙන්ම සමන්විතවී තිබුණේ රු. මිලියන 4,000 ක් ප්‍රාග්ධනයක් පමණක් සමඟ, ඉතිරි රු. මිලියන 8,000 ප්‍රාග්ධනය ඉක්මවා එකතු වූ පොලියක් ලෙසිනි.! - එනම්:



භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
Department of Treasury Operations **A10(c)**

General Treasury, Ministry of Finance & Planning, P.O.Box: 1559, Colombo 01
Fax: 0094 112 320042 / 0094 112 484838
General: 0094 112 484500 / 0094 112 484600

My No. TO/Rev/SL/2/135Vol.iv
Your No.
Date 10.06.011

Mr. T.Nadesan,
Chairman,
Hotel Developers (Lanka) PLC.
C/o Colombo Hilton,
Colombo 01.

Dear Sir,

**Loans Granted by the Government of Sri Lanka for the Settlement of the Loans to the Japanese Lenders Mitsui &Co Ltd .and Taisei Corporation.**

This refers to your letter dated 6th May 2011 on the above subject.

It is regretted to inform our inability to accept the repayment schedule proposed by HDL, extending the repayment period for 18 years.

In view of the high occupancy ratio resulting in development of tourism industry, the General Treasury requests HDL to repay the outstanding amount of Rs.12,098,634,769.77 within a shortest period of time preferably two years, on monthly installment basis.

I, therefore, would request you to keep the Board of Directors informed of the Treasury's stand.

Thanking you.

Yours faithfully

D..Widanagamachchi
Deputy Secretary to Treasury

සමපාත ලෙස එම අවස්ථාවේදීම, හිල්ටන් හෝටල් සමාගම නැවත මූල්‍යමය වශයෙන් ප්‍රතිව්‍යුහගත කිරීමට සහ ගොඩ නැඟීම සඳහා, කර්තෘ විසින් 2011.11.8 වන දින, 2007 අංක 7 දරණ සමාගම් පනතේ අදාල විධිවිධාන යටතේ, ශ්‍රී ලංකා වාණිජ මහාධිකරණයේ නඩුවක් පවරා, අධිකරණ බලය

ක්‍රියාත්මක කරවීමට පියවර ගෙන තිබුණි. එම අවස්ථාවේදීම, කර්තෘ විසින් මෙලෙස අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම පිළිබඳව 2011.11.8 වන දිනම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක චමල් රාජපක්ෂ වෙත දැනුම් දී තිබුණි.



DAILY MIRROR - Tuesday October 25, 2011

# BILL TO ACQUIRE UNDERUSED ENTERPRISES OR ASSETS

*DSG says it was not drafted by the Legal Draftsman's Dept. but by a private firm*

An Act to provide for the vesting in the State identified Underperforming Enterprises and Underutilized Assets
MAHINDA RAJAPAKSA

BY S.S. SELVANAYAGAM

LEGAL

In a surprise move, the government is to enact new laws to acquire underperforming enterprises and underutilized assets.

President Mahinda Rajapaksa has forwarded to the Supreme Court the draft Bill titled, "an Act to provide for the vesting in the State identified Underperforming Enterprises and Underutilized Assets", as an urgent Bill in the national interest.

The President could refer a draft bill to the Supreme Court for a ruling on its constitutionality before it is presented to parliament.

The draft bill was taken up yesterday before a Bench comprising Chief Justice Shirani A. Bandaranayake, Justices P.A. Ratnayake and Chandra Ekanayake.

See A6

- Bill becomes necessary in the national interest
- Competent Authority to control and administer process
- Those refusing to deliver, shall be guilty of offence

SMS your views & name 0777 009 998

## BILL TO ACQUIRE UNDERUSED ENTERPRISES OR ASSETS

Contd. from A1

The Supreme Court will communicate its determination to the President and the Speaker. Deputy Solicitor General Janak de Silva with Senior State Counsel Nerin Pulle appeared for the Attorney General.

**When the Chief Justice asked whether the Bill was drafted by the Legal Draftsman's Department, the Deputy Solicitor General said it was drafted by a private firm.**

The Chief Justice then told him that if that was the case there should be a representative from the Legal Draftsman's Department as well.

Under this Act, anyone who refuses or fails to deliver such Enterprises or Assets shall be guilty of an offence under the Act and shall on conviction after summary trial before a Magistrate be liable to imprisonment of ten years or a fine or both.

The Bill is to appoint in respect of each one or more of such underperforming enterprises or underutilized assets, a Competent Authority to provide for their effective managing, administration or revival through alternative utilization and the payment of compensation.

Under this Act, anyone who refuses or fails to deliver such Enterprises or Assets shall be guilty of an offence under the Act and shall on conviction after summary trial before a Magistrate be liable to imprisonment of ten years or a fine or both

එනමුත් හිතාමතාම එවැනි වැදගත් කාරණයක් නොසලකා හැර, පාර්ලිමේන්තු කථානායකවරයා විසින් ඉහත පනත් කෙටුම්පත පසුවදා එනම් 2011.11.9 වන දින විවාදයට ගැනීමට සහ එම පනත අනුමත කර ගැනීමට අවසර දෙන ලදුව, ඉන්පසුව 2011.11.11 වන දින කඩිමුඩියේ නීතියක් ලෙස සහතික කිරීම මගින් හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගම ශ්‍රී ලංකා රජයට අත්පත් කර ගැනීම සිදු කරන ලද්දේ, ව්‍යවස්ථාදායක බලය අධිකරණ බලය අභිභවා යාමෙනි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තු කථානායකවරයා විසින් ව්‍යවස්ථාදායකය බලය අධිකරණ බලයට පටහැනිව ඉක්මවා යමින් අභ්‍යාස කිරිමට ඉඩ ලබා දී ඇත. එම කරුණු ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ එම්. ඒ. සුමන්දිරන් විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු කථානායකවරයාගේ අවධානයට යොමු කර තිබියදීත්, කථානායකවරයා විසින් එය ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කර ඇත.!

**PARLIAMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**REVIVAL OF UNDERPERFORMING ENTERPRISES OR UNDERUTILIZED ASSETS ACT, No. 43 OF 2011**

**[Certified on 11th November, 2011]**

*Printed on the Order of Government*

Published as a Supplement to Part II of the **Gazette of the Democratic Socialist Republic of Sri Lanka** of November 11, 2011

PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA
TO BE PURCHASED AT THE GOVERNMENT PUBLICATIONS BUREAU, COLOMBO 5

**Price : Rs. 22.00** **Postage : Rs. 20.00**

*Revival of Underperforming Enterprises or Underutilized Assets Act, No. 43 of 2011*

**SCHEDULE I**

UNDERPERFORMING ENTERPRISES

"Underperforming Enterprise" means a company or other authority, institution or body established by or under any written law for the time being in force, in which the Government owns shares and where the Government has paid contingent liabilities of such enterprise and the Government is engaged in protracted litigation with regard to such Enterprise, which is prejudicial to the national economy and public interest.

2011.11.11 වන දින එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තු කථානායකවරයා විසින් නීතියක් බවට සහතික කල බව නොදැන සිටීමෙන්, සහ ඔහු විසින් 2011.11.22 වන දින පමණක් මෙම පනත් කෙටුම්පත නීතියක් බවට සහතික කල බව අනාවරණය කර ගෙන තිබුණ බැවින්, කර්තෘ විසින් ඊට පෙර පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූල භාවය අභියෝගයට ලක් කරමින් 2011.11.17 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු නිමිත්තක් ගොනු කර ඇත්තේ, විශේෂයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123 (3)ව්‍යවස්ථාව හුවා දක්වමින්, කිසිසේත්ම මෙයට පෙර එසේ සිදු කිරීමට පැවති ඔහුගේ 'අශක්‍යතාව' පෙන්වා දෙමින් වන අතර, එසේම එම පනත් කෙටුම්පත මත හදිසි සහ හොර රහස් ආකාරයකට ශ්‍රේෂ්ඨාධිකරණය මගින් විශේෂ නිශ්චයක් ලබා දී ඇති බවද කියා පාමිනි.

පුදුමාකාර ලෙස, අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක විසින්, පී. ඒ. රත්නායක සහ චන්ද්‍රා ඒකනායක විනිසුරුවරුන්ගේ එකඟත්වයද ඇතිව ඇයගේ නිල කාමරයේදීම ඉහත අභියෝගයට ලිඛිත සටහන් තබා ඇත්තේ, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පනත් කෙටුම්පත පිළිබඳ විමසන අවස්ථාවේදී එයට මැදිහත් වීමට අවශ්‍ය ඕනෑම පාර්ශවයකට එම අවස්ථාවේදී අවසර ලබා දී තිබුණු බවත්, වරක් කෙටුම්පත මත විශේෂ නිශ්චයක් සිදු කල පසු, ඒ සම්බන්ධයෙන් එසේ මැදිහත් වීමට අවසර ලබා ගත නොහැකි බවත් සඳහන් කරමිනි.

සියලුම ප්‍රායෝගික තත්වයන් මත එසේ මැදිහත් වීමට සෑම අයුරකින්ම 'අශක්‍යතාවක්' පැවති බව තේරුම් ගත යුතු වන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරයට 2011.10.21 වන සිකුරාදා දින එම පනත් කෙටුම්පත ලැබීමෙන්, ඒ සමඟ එළඹෙන සති අන්තයක් තිබියදී, ඊලඟ සතියේ පළමු දිනය වූ සඳුදා දින එනම් 2011.10.24 දින උදෑසනම එය ශ්‍රේෂ්ඨාධිකරණයේ විමසීමට ගැනීමය. එසේ සතියේ පළමු දිනය වූ සඳුදා දිනයේදීම එම පනත් කෙටුම්පත විමසීමට ගැනීමෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ එම අවස්ථාවේදී පෙනී සිටීම කිසිසේත්ම සිදු කල නොහැක්කක් බව එනම් එහි 'අශක්‍යතාවය' ශ්‍රේෂ්ඨාධිකරණයට අවබෝධ නොවූයේ මන්ද යන්න අවශ්‍යයෙන්ම මතු වන ප්‍රශ්නයකි.?

සෑම රජයේ පාලන ආයතනයක්ම ව්‍යවස්ථානුකූලව මූලික අයිතිවාසිකම් ගරු කිරීමට, ආරක්ෂා කිරීමට සහ වර්ධනය කිරීමට බැඳී සිටීම මත, තමා වෙත ලැබිය යුතු වූ ස්වභාවික යුක්තිය ප්‍රතිශේධනය කරනු ලැබූ අදාල පාර්ශවකරුවකු වශයෙන් කර්තෘ විසින් 2011.11.14 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරනු ලැබ තිබුණේ, අනෙකුත් කරුණු අතරතුර, මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනයේ 17 (1) වගන්තිය උපුටා දක්වමිනි.- *එනම්:*

> "ව්‍යවස්ථාව 17 (1)
>
> (1) සෑම අයෙකුටම තමන් සතුව තනිව පවතින දේපලකට මෙන්ම අනෙක් අය සමඟ සමාගයෙන් පවතින දේපළ සඳහා අයිතිය ඇත.
>
> (2) කිසිවකුට අත්තනෝමතිකව ඔහුගේ දේපල පැහැර ගත නොහැකිය."

කර්තෘ විසින්, 2002 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රේෂ්ඨාධිකරණයේ සත් පුද්ගල විනිසුරු මඩුල්ලක් විසින් සිදු කල විශේෂ නිශ්චයකින් පහත සඳහන් 'සිද්ධාන්ත' උපුටා දක්වා තිබුණි. - *එනම්:*

> "අග විනිසුරු සරත් එන්. සිල්වා සභාපතිත්වය දැරූ විනිසුරු ජේ. ඒ. එන්. ද සිල්වා, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ශිරාණි බණ්ඩාරනායක, එස්. ඩබ්. බී. වඩුගොඩපිටිය, ඒ. ඉස්මයිල්, පී. එදුස්සූරිය සහ එච්. එස්. යාපාගෙන් සැදුම්ලත් ඔබගේ ගරු අධිකරණයේ සත් සාමාජික විනිසුරු මඩුල්ලක් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අසාර්ථක වූ 18 වන සහ 19 වන සංශෝධනයන් පිළිබඳව, අනෙකුත් කරුණු අතරතුර 2002 ඔක්තෝබර් මස පහත පරිදි නිශ්චය කරනු ලැබ ඇත. පහත උධෘතයන් අවධාරණය කොට ඇත:

➢ "එබැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සහ දේශපාලන න්‍යායයන්හි සියලුම සමෘද්ධිමත් කොටස්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාල වගන්තීන්හි නිරූපණයන් මත, ඒ සම්බන්ධව ප්‍රකාශ කල හැකි වන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් එක් අංගයක් මත ආරෝපණය කරනු ලැබූ ඕනෑම බලයක් රජයේ වෙනත් අංගයක් වෙත මාරු කිරීමට හෝ රජයේ එම අංගයෙන් අත්හැර දැමීමට හෝ ඉවත් කිරීමට නොහැකිය සහ එවැනි පැවරුමක්, අත් හැර දැමීමක්, හෝ ඉවත් කිරීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන සහ 4 වන ව්‍යවස්ථාවන් එකට ගත් කල කියවෙන පරිදි එකඟවිය නොහැකි පරමාධිපත්‍යයේ "අන්සතු කිරීමක් " විය හැකිය."

➢ " ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එය විසින්ම දරා ගැනීමට නම්, සෑම අංගයක් වෙතම ආරෝපණය කරන ලද බලය සම්බන්ධයෙන්, රජයේ අංග තුන අතර සිදුවන පහර ගැසීම්හි සමබරතාවය අවශ්‍යයෙන්ම පවත්වා ගැනීමට කටයුතු කර පවත්වා ගත යුතුය."

➢ " ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් රජයේ එක් අංගයක් වෙත ආරෝපණය කරන ලද බලය, එවැනි බලයක් අනෙක් අංගයකට පැවරීමේදී; හෝ අත් හැර දැමීමේදී හෝ ඉවත් කිරීමේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන සහ 4 වන ව්‍යවස්ථාවන් එකට ගත් කල කියවෙන පරිදි එකඟවිය නොහැකි පරමාධිපත්‍යයේ "අන්සතු කිරීමක් " විය හැකිය."

➢ රජයේ එක් අංගයක් වෙත පවතින ව්‍යවස්ථාපිත බලය අනෙකුත් අංගයට සම්බන්ධව පරීක්ෂා කර අභ්‍යාස කර, සෑම අවස්ථාවකම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී මහජනතාවගේ විශ්වාසය තුල සොයා බලා අභ්‍යාස කල යුතු වේ. මෙය නවීන සංකල්පයක් නොවේ. මහජන නීතියේ මූලික තර්කය වන්නේ බලය විශ්වාසය තුල රඳා පවතින බවයි. එංගලන්තයේ පරිපාලන නීතියේ පර්යාලෝකය විසින් බලය ප්‍රදානය කිරීම තුල ගම්‍ය වන 'විශ්වාසය' පහත පරිදි ප්‍රකාශ කර ඇත:

> ' මහජන පරමාර්ථ උදෙසා ප්‍රදානය කරන ව්‍යවස්ථාපිත බලය විශ්වාසය මත ප්‍රදානය කරන අතර, එය නිසැකයෙන්ම - එමගින් කියවෙන්නේ, එය භාවිතා කිරීමට වලංගු වන්නේ, අදහස් කරන ලද අනුමාන කිරීම ප්‍රදානය කරන ලද කල්හි එය පාර්ලිමේන්තුව සමඟ නිවැරදි පිළිවෙල සහ අයිතිය අනුව සිදු කල විට පමණකි." – (පරිපාලන නීතිය - 8 වන මුද්‍රණය, 2000 - එච්. ඩබ්. ආර්. වේඩ් මහ සී. එෆ්. ෆෝසිත්, පිටු අංක 356)"

➢ " 'නීතියේ ආධිපත්‍යය' අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පදනම බව මෙම අධිකරණයේ විනිශ්චයන් කිහිපයකදීම ස්ථිර ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇත."

➢ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික මූලධර්මයන් පිළිබඳ ඉදිරිපත් කරන ඒ. වී. ඩිසෙයිගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීතිය සත්‍ය වශයෙන් ගනු

ලබන්නේ, 'නීතියේ ආධිපත්‍යය' ට අදහස් තුනක් පවතින බවයි. ඉන් එකක් පහත පරිදි විස්තර කරනු ලැබ ඇත:

> "එයින් අදහස් කරනුයේ, පළමු අවස්ථාව, විධිමත් නීතියේ උසස් බව හෝ ශ්‍රේෂ්ඨ බව නිසැකවම අත්තනෝමතික බලයේ බලපෑමට විරුද්ධ සහ අත්තනෝමතිකභාවය හෝ විශේෂ බලය පැවතීම බැහැර කරන හෝ රජයේ කොටසක් මත පැතිරුණු අභිමතානුසාරී බලතල සහිත බවයි. ඉංග්‍රීසීන් නීතිය මගින් තනිව සහ නීතිය මගින් පාලනය කෙරේ. ..."

- "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමස්ථ නිර්මිතය හරහා දිවෙන එක් මූලධර්මයක් පවතී නම්, එය නීතියේ ආධිපත්‍යය මූලධර්මය වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, නීතියේ සීමාවන් ඇතුලත රජයේ සෑම අංගයකම කර්තව්‍යයන් විශ්වාසව තහවුරු කර පවරා දෙනු ලබන්නේ අධිකරණ බලය මගින් වන අතර සහ එබැවින් නීතියේ ආධිපත්‍යය අර්ථදායී සහ සඵලදායී වේ. – *(ඉන්දියානු විනිශ්චයකින් උපුටා ගෙන ඇත.)* "

- "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඕනෑම අංගයක් සඳහා හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත අංගයන්ට බාධා නොමැති නිදහස් අභිමතය හෝ බලතල ආරෝපණය කර ගෙන නොමැත. "

- " "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තහවුරු කර ගැනීම සහ ආරක්ෂා කර ගැනීම සඳහා " ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිව් වන පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව සිදු කරනු ලැබූ ගරු ගාම්භීර ප්‍රකාශයට අනුව, මෙම ප්‍රතිපාදන ක්‍රියාවෙහි යෙදවීමට අපට සිදු වේ. "

කර්තෘ විසින් පහත උධෘතයන්ද උපුටා දක්වනු ලබයි:

- භාගවතී ජේ. ගේ *රාජස්ථාන් රජය සහ ඉන්දියානු සමාගමය, ඒඅයිආර් 1977 එස්සී 1361, 1413;*

> " ...... ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පවතින බලය යටතේ බලධාරීත්වය එකී බලයේ සීමාවන් තුල කටයුතු කරන්නේද, නැතහොත් එය ඉක්මවා කටයුතු කරන්නේද යන්න පිළිබඳව ප්‍රශ්න පැන නැඟී ඇති අතර, එය නිශ්චිතව තීරණය කල යුතු වන්නේ අධිකරණය විසිනි. ඒකාන්තයෙන්ම, එසේ සිදු කිරීම සඳහා එය සතු ව්‍යවස්ථාපිත වගකීමකි. .... කිසිවකුව කෙසේවත් ඉහළ රැඳීමට සහ ව්‍යවස්ථාව යටතේ එහි බලයේ ප්‍රමාණය තනි විනිශ්චයක් මගින් බලධාරීත්වයකට උදාර ලෙස හිමිකම් පෑමට නොහැකි හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මත පවතින එවැනි බලයක් එහි ක්‍රියාවන් මත සීමා නියම කිරීමට නොහැකිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අවසන් නිරූපිතයා අධිකරණයයි. ........ මෙම අධිකරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වටිනාකම් පවත්වා

ගැනීමට සහ ව්‍යවස්ථාපිත සීමාවන් බලාත්මක කිරීම සඳහා වේත එය නීතියේ ආධිපත්‍යයේ සාරයයි. ...... “

- එස්.සී. එෆ්ආර් අංක 431/2001 හි උධෘතයන්;

  “ රජයේ බලධාරීන් සහ නිලධාරීන් වෙත පවරා ඇති සියලුම බලයන් සහ අභිමතයන්, මහජනතාවගේ විශ්වාසය සඳහා එය ආරක්ෂා වන පරිදි ඒ මත, සාධාරණ හේතු සහිතව, හොඳ හිතින් සහ මහජන යහපත පරිදි අදාළ වන වටපිටාවක, නීතිමය අයුරින් සිදු කිරීමට හැකි වන පරිදි ස්ථිරව ස්ථාපිත කර ඇත; ඔවුන්ගේ නිරපේක්ෂ හෝ නැවත සමාලෝචනය කිරීමකින් තොර බාධා කිරීම් නොමැත; සහ එය ඔවුන්ගේ අභ්‍යාසයන්හි නීතිමයභාවය සහ ශිෂ්ඨත්වය වන අතර, ඔවුන් වෙත සාකච්ඡා කර පවරා දුන් අරමුණු මත සම්බන්ධව එම අභ්‍යාසයන් විනිශ්චය කල යුතුය. “

කර්තෘගේ ඉහත මූලික අයිතිවාසිකම් නඩුව, 2011.11.25 වන දින ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ඔහු විසින්ම පෞද්ගලිකව පෙනී සිටිමින් තහවුරු කර ඇත. ඔහු විසින් තර්ක කරන ලද්දේ, ඉහත කෙටුම්පත මත ශ්‍රේෂ්ඨාධිකරණයේ විසින් 2011.10.24 වන දින ලබා දුන් විශේෂ නිශ්චය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවය. විශේෂයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ123 (3) ව්‍යවස්ථාවට අනුව එම විශේෂ නිශ්චය ශූන්‍ය සහ බලරහිත බවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව එසේ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය බල රහිතව සිටි බවත් කියාපාමිනි.

කර්තෘ විසින් තහවුරු කර ඇත්තේ, 2011.10.24 දින විශේෂ නිශ්චය මගින් ශ්‍රේෂ්ඨාධිකරණය 'සැක' සහ ‘ප්‍රශ්න‘ මතු කර ගෙන තිබුණු බව හෙලි වූ අතර සහ ඒ මත, ඒ පිළිබඳව පැහැදිලි කිරීම් නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් විසින් සිදු කිරීමෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123 (3) ව්‍යවස්ථාව අනුව එසේ 'සැක' සහ ‘ප්‍රශ්න‘ මතුවීමෙන් එම පනත් කෙටුම්පත ව්‍යවස්ථාවට අනනුකූල බව නිශ්චය වීමයි.

කර්තෘ විසින් සාර්ථකව තර්ක කර සිටින ලද්දේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 (3) ව්‍යවස්ථාව පාර්ලිමේන්තු පනත් වලට පමණක් අදාල වන අතර, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරන විශේෂ නිශ්චයන්ට එය අදාල නොවන බවය. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින්ම ශ්‍රේෂ්ඨාධිකරණ නිශ්චයන් සමාලෝචනය කොට නැවත පරීක්ෂා කල හැකි බවත්ය.- එනම්:

> **80.** (3) අවස්ථාවෝචිත පරිදි ජනාධිපතිවරයාගේ හෝ කථානායකවරයාගේ සහතිකය පනත් කෙටුම්පතක් මත සටහන් කරනු ලැබූ පසු එම පනත් කෙටුම්පත නීතිය බවට පත් වන අවස්ථාවක ඒ පනතෙහි වලංගුභාවය පිළිබඳව පරීක්ෂා කිරීම ඒ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීම කිසිම අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් හෝ විසින් නොකළ යුත්තේ ය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ මුලසුන දැරූ විනිසුරු එන්. ජී. අමරතුංග සහ අනික් විනිසුරුවරුන් වූ සුරේෂ් චන්ද්‍ර සහ සත්‍යා හෙට්ටිගේ සෑහීමකට පත් වීමෙන්, කර්තෘගේ අයදුම්පත භාර ගෙන තිබූ අතර, ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛන භාර නිලධාරි ලේඛකාධිකාරී හරහා වගඋත්තරකරුවන් වෙත නොතිසි නිකුත් කිරීමට නියෝග කර තිබූ අතර, සහ කර්තෘගේ පෙත්සම සංශෝධනය කිරීමට ඔහුට අවසරය ලබා දී තිබුණේ, ඉහත පනත් කෙටුම්පත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කතානායකවරයා විසින් නීතියක් බවට සහතික කර ඒ බව දැනුම් දී තිබූ බවට කර්තෘ විසින් දැනුවත් වූයේ 2011.11.22 දින වූ අතර, එනමුත් කර්තෘ විසින් ඊට පෙර 2011.11.14 දින ඔහුගේ පෙත්සම ගොනු කර තිබූ බැවිනි.

ඒ අනුව, ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉහත කී නියෝගය පරිදි කර්තෘ විසින් ඔහුගේ සංශෝධිත පෙත්සම, වගඋත්තරකරුවන් වෙත නොතිසි සමගම 2011.12.16 වන දිනැතිව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර, ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛන භාර නිලධාරි ලේඛකාධිකාරී විසින් අදාල වගඋත්තරකරුවන් වෙත 2012.1.26 වන දිනට පැමිණෙන ලෙස නොතිසි නිකුත් කරන ලදී.

කර්තෘගේ ඉහත කී අයදුම්පත, 2011.10.24 දිනැති විශේෂ නිශ්චය නැවත සමාලෝචනය සහ පරීක්ෂණයක් සිදු කිරීම සඳහා බැවින්, කර්තෘ විසින් මෝසමක් ගොනු කරමින්, ඔහු විසින් සිදු කල හැකි පරිදි අයැදුමක් ඉදිරිපත් කර සිටියේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 132 ව්‍යවස්ථාව අනුව අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පුළුල් විනිසුරු මඬුල්ලක් ඉදිරියේ මෙම විමසීම නැවත සමාලෝචනය සහ පරීක්ෂණයක් කිරීමට අයැද සිටිමිනි.

කෙසේ වෙතත්, අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක විසින් කර්තෘගේ එම මෝසම ශ්‍රේෂ්ඨාධිකරණයේ පුළුල් විනිසුරු මඩුල්ලක් ඉදිරියේ නැවත සමාලෝචනය සහ නැවත පරීක්ෂණයක් සඳහා විමර්ශනය සිදු කිරීමට අවස්ථාව ලබා නොදුන් අතර, ඉහත කී කර්තෘගේ අයදුම්පත භාර ගෙන වගඋත්තරකරුවන්ට නොතිසිද නිකුත් කර තිබූ එම ශ්‍රේෂ්ඨාධිකරණ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල වූ එන්. ජී. අමරතුංග, සුරේෂ් චන්ද්‍ර සහ සත්‍ය හෙට්ටිගේ විසින්ම 2012.2.9 වන දින කර්තෘගේ අයදුම්පත විමසීමට උපදෙස් ලබා දෙමින් නියෝග කර තිබුණි.

පහත සඳහන් පුද්ගලයින් ඉහත නඩුවේ වගඋත්තරකරුවන් විය. නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල්ට අමතරව, ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශකද වූ ජනාධිපති නීතිඥ ඩී. එස්. විජේසිංහද වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටියේය:

ජනාධිපති මහින්ද රාජපක්ෂ, මුදල් අමාත්‍යවරයා ලෙස
බැසිල් රාජපක්ෂ, ආර්ථික සංවර්ධන අමාත්‍ය
පී. බී. ජයසුන්දර, මුදල්අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයේ ලේකම්
ජී. එල්. පීරිස්, විදේශ කටයුතු අමාත්‍ය
සී. ආර්. ද සිල්වා, ජනාධිපති නීතිඥ, හිටපු නීතිපති
මොහාන් පීරිස්, ජනාධිපති නීතිඥ, හිටපු නීතිපති
රවුෆ් හකීම්, අධිකරණ අමාත්‍ය
සුහද ගම්ලත්, ලේකම්, අධිකරණ අමාත්‍යාංශයේ
චමල් රාජපක්ෂ, ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ කථානායක
ගරු. නීතිපති

ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු මඩුල්ල ඉදිරියේ ඔහුගේ ස්ථාවරය ඒත්තු ගැන්වීමට, කර්තෘ විසින් පුළුල් ලිඛිත ඉදිරිපත් කිරීම් සහ වෙහෙසකර වාචික ඉදිරිපත් කිරීම් සිදු කර තිබුණි.

කර්තෘ විසින් සිය සවිස්තර කරුණු ඉදිරිපත් කිරීමෙන්, අනෙකුත් කරුණු අතරතුර පෙන්වා දෙනු ලැබුවේ, පහත දැක්වෙන දිස්ත්‍රික්ක 7 ක පිහිටි ව්‍යවසායයන් 36 ක බිම් කැබලි 77 ක් රජයට පවරා ගෙන ඇති බවය.- *එනම්:*

| | |
|---|---|
| බස්නාහිර පළාත | -ඉඩම් 32 |
| ඌවපළාත | -ඉඩම් 35 |
| උතුරු මැද පළාත | -ඉඩම් 2 |
| මධ්‍යමපළාත | -ඉඩම් 2 |
| සබරගමුව පළාත | -ඉඩම් 3 |
| නැගෙනහිර පළාත | -ඉඩම් 1 |
| දකුණුපළාත | -ඉඩම් 2 |

සහ එසේ ඉහත කාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල බවට තීරණය කර තිබී ඇත්තේ, 'ජාතික ප්‍රතිපත්ති' යටතේ සියලු විෂයයන් මධ්‍යම රජය වෙත පවරා ඇති බව පෙනී යන බැවින්, ඒ බව ගම්‍ය වන පරිදි ප්‍රකාශ කරමින් වන අතර, එබැවින් මෙය 'ජාතික ප්‍රතිපත්ති' පිළිබඳව කාරණයක් බව ගම්‍ය වන බැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බව පෙනී යන බව පවසමිනි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ජී)(7) ව්‍යවස්ථාව අනුව 'ජාතික ප්‍රතිපත්ති' පිළිබඳ ඉඩම් ඇතුලත් නොවන බව, කර්තෘ විසින් පැහැදිලි කල අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ජී)(3) ව්‍යවස්ථාව ප්‍රකාර පළාත් සභා යටතේ ඉඩම් ඇතුලත් කර ඇති බව පැහැදිලි කරන ලදී. එමගින් සෑම පළාත් සභාවකටම ජනාධිපතිවරයා විසින් එම පනත් කෙටුම්පත යොමු කිරීම අවශ්‍ය වී තිබූ අතර, තවද වෙනත් නඩු අවස්ථා කීපයකදීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සෑම අවස්ථාවකම නිශ්චය කොට හෝ විනිශ්චයට භාජනය වී තිබුණේ ඒ අනුව බවත්, එසේ හෙයින් සැකයක විශ්වාසයක් ඇති වන්නේ, ඉහත කී විශේෂ නිශ්චය සිදු කිරීමේදී එය හොර රහසේ මෙලෙස සිදු කර තිබුණේ යම්කිසි බාහිර අවශ්‍යතාවක් මතද යන ප්‍රශ්නය පැන නගිමිනි.?

ඒ සම්බන්ධයෙන් අන්තර් ජාතික සම්මුතීන් හා ගිවිසුම් උල්ලංඝනය වී ඇති බව කර්තෘ විසින් පෙන්වා දී තිබෙන්නේ, එකී නිශ්චය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව යයි සඳහන් කරනු ලැබ ඇත්තේ, මෙම පවරා ගැනීම් සිදු කර තිබෙන්නේ 'මහජන කටයුතු' සඳහා යයි පවසමින් බැවිනි. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 ව්‍යවස්ථාව ප්‍රකාරව සෘජුව නියම කර ඇති පරිදි, එසේ පවරා ගත හැක්කේ 'ජාතික ආරක්ෂාව සුරැකීමට' පමණක් වේ.

ඒ කෙසේ වෙතත්, 2012.2.9 වන දින කර්තෘගේ කරුණු ඉදිරිපත් කර අවසානවත්ම, ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රි පුද්ගල විනිසුරු මඬුල්ල විසින් 2011.10.24 දින විශේෂ නිශ්චය නැවත සමාලෝචනය සහ පරීක්ෂණයක් සඳහා පිළිගත යුතු යයි බැලූ බැල්මට හැඟෙන නඩුවක් කර්තෘ විසින් ස්ථාපිත කල බවට පිළිගැනීමක් ඇති 'ඉඟියක්' දෙනු ලැබුවේ, එම නැවත සමාලෝචනය සහ පරීක්ෂණයක් සඳහා 2011.10.24 වන දින විශේෂ නිශ්චය ලබා දුන් එම විනිසුරු මඬුල්ල විසින්ම එසේ විභාග කල යුතු බව පවසමින්ය.

එසේ ප්‍රකාශ කිරීමත් සමගම, ශ්‍රේෂ්ඨාධිකරණය ත්‍රි පුද්ගල විනිසුරු මඬුල්ලට කර්තෘ විසින් පෙන්වා දෙනු ලැබුවේ, ඔහු විසින් විශේෂයෙන්ම 2012.1.18 වන දින මෝසමක් මගින් මෙයට පෙර අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 132 ව්‍යවස්ථාව අනුව ඉදිරිපත් කල අයදුම මගින් 2011.10.24 වන දින ලබා දුන් විශේෂ නිශ්චය නැවත සමාලෝචනය සහ පරීක්ෂණයක් කිරීමට අපේක්ෂා කරනු ලැබුවේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123(3) ව්‍යවස්ථාව අනුව ප්‍රමාද දෝෂයක් සහ / හෝ අන්‍යොන්‍ය වශයෙන් බලරහිත වූ අවස්ථාවක් බැවින් එය උපරිමව පොදු සහ මහජන වැදගත්කමක් ඇති කරුණක් බවට පවසමිනි.

ඉහත කී කර්තෘගේ මෝසම සම්බන්ධයෙන් නඩු ගොනු පරීක්ෂා කර එය සත්‍යයක් යයි වටහා ගැනීමෙන් පසුව, සියල්ලන්ම මවිතයට පත්කරවමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ එම ත්‍රි පුද්ගල විනිසුරු මඬුල්ල විසින් ප්‍රකාශ කර සිටියේ - 'අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක විසින් ඔවුන්ට නියෝග කර තිබුණේ කර්තෘට තර්ක ඉදිරිපත් කිරීමට පමණක් අවස්ථාව ලබා දිය යුතු බවත්, නමුත් මෙම නඩුව ඉදිරියට ගෙන යාම සඳහා ඔහුට අවසරය නොදෙන ලෙසත් බවය'. ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිසුරු මඬුල්ලකට කලින් නියෝග කිරීමට කිසිදු අයිතියක්, අග විනිසුරු ශිරාණි බණ්ඩාරනායකට නොතිබුණි. !

ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රි පුද්ගල විනිසුරු මඬුල්ල විසින් සිදු කල ඉහත කී පැහැදිලිතාවයෙන් යුතු දැනුම්දීම මත, ශ්‍රේෂ්ඨාධිකරණයේ සිටි පුද්ගලයන් නැගූ ප්‍රශ්නයක් වූයේ - 'පළමු අවස්ථාවේදීම විත්තිවාචකය ඉදිරියට ගෙන යෑමට අවස්ථාව ලබා නොදීමට එසේ නියෝගයක් තිබියදී, එසේ නම්

කර්තෘට මෙම ශ්‍රේෂ්ඨාධිකරණ ත්‍රි පුද්ගල විනිසුරු මඬුල්ල ඉදිරියේ එම වෙහෙසකාරී වුත්, සවිස්තර කරුණු කරණා එලෙස දීර්ඝ ලෙස ඉදිරිපත් කිරීමට අවශ්‍ය කර තිබුණේ මන්ද හෝ කුමක් සඳහාද යන්නය.?

ඉහත සඳහන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ල ඉහත සඳහන් පරිදි සිදු කල දැනුම් දීම මත, ඊට ආනුෂංගිකව කර්තෘ විසින් තවත් රහස්‍ය ලිඛිත දේශනයක් ඉදිරිපත් කරමින් තර්ක දක්වා තිබුණේ, ඉහත කී තර්කයන්ට අමතරව වැඩිපුර තර්ක සේ, එනම් පිළිඹිබු වූ අධිකරණ නැඹුරුව මත, සාමි මන්ත්‍රීවරුන්ගේ අභියාචනාවක තීන්දුවක් හුවා දක්වමින්, අසාධාරණයක් නිවැරදි කිරීමට තම ආවේණික අධිකරණ බලය අභ්‍යාස කිරීම මත, සාමිවරුන්ගේ පස් පුද්ගල කාරක සභාවක් මගින් පිනෝචේ පිළිබඳව පෙර විනිශ්චය වෙනස් කරනු ලැබීමෙන්, එලෙස 2011.10.24 දින විශේෂ නිශ්චයද වෙනස්කල යුතු හෝ බලරහිත කල යුතු බව සනාථ කරමින්ය.- *එනම්:*

HOUSE OF LORDS

**Judgment - In Re Pinochet**

Lord Browne-Wilkinson
Lord Goff of Chieveley
Lord Nolan
Lord Hope of Craighead
Lord Hutton

සත්‍ය වශයෙන්ම, කර්තෘ විසින් සාමිවරුන්ගේ පිනෝචේ පිළිබඳව විනිශ්චය පූර්වාදර්ශයට ලක්කරමින්, ඔහු විසින් අනාවරණය කල රහස්‍ය ලිඛිත කරුණු සහ සිදුවීම් ගෙනහැර දක්වමින් පිළිඹිබු වන අධිකරණ නැඹුරුවේ ඉහත කී සාමිවරුන්ගේ විනිශ්චයේ කාරණයට වඩා බරපතල තත්වයක් පිළිබඳව මෙම නඩුවේ ඇතැයි තර්ක කරමින්, හෙළි කරනු ලැබීය.

නීතිඥවරු දෙපල වූ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සහ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක ජනාධිපති නීතිඥ ඩී. එස්. විජේසිංහ ඒ විගසම තැතිගැන්වී සහ කලබලවී, කර්තෘගේ ඉහත කී වැඩිදුර රහස්‍ය ලිඛිත දේශන ඉදිරිපත්කිරීමටතරයේ විරුද්ධ වී ඇත. කර්තෘ විසින් එමගින් සැබවින්ම සත්‍ය කරුණු සහ තත්වයන් මත පිළිඹිබු වූ අධිකරණ නැඹුරුවක් පෙන්නුම් කරන බව සහ ඒ මත, ඉහත කී සාමිවරුන්ගේ විනිශ්චය මෙන්, 2011.10.24 වන දින ලබා දුන් විශේෂ නිශ්චය අනිවාර්යයෙන්ම බලරහිත

කල යුතු හෝ වෙනස් කල යුතු බවත් අරමුණු වන බවයි. නීතිඥවරු දෙපල විසින් ප්‍රගහණය කරමින් ප්‍රකාශ කරන ලද්දේ, ඉහත කී රහස්‍ය ලිඛිත දේශන ප්‍රසිද්ධියට පත් වීමෙන් පොදු මහජනයා තුල මහත් ආන්දෝලනයක් ඇති කරනු ඇතැයි ඔවුන් තුල බියක් ඇති බවයි.

එයට ප්‍රතිචාර දක්වමින්, ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විසින් කර්තෘ විසින් ඉදිරිපත් කල ලිඛිත ඉදිරිපත් කිරීම්වල සියලු පිටපත් ආපසු ලබා දෙන ලෙසට නියෝග කරන ලදී. තේරුම්ගත නොහැකි වන්නේ, එකී ලිඛිත ඉදිරිපත් කිරීම් විවෘත අධිකරණයේදී ඉදිරිපත් කර තිබුණේ මහජන යහපත උදෙසා වීමෙන්, එම කරුණු යටපත් කර මහජනතාව ඒ පිළිබඳව දැනුවත් වීමෙන් සඟවා තිබීමෙන්, ඔවුන්ට එම කරුණු දැනගැනීමට ඇති නීත්‍යානුකූල අයිතිය යටපත් කිරිමක් නොවන්නේද යන්න වන අතර, එම ප්‍රශ්නය මතුවේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විසින් කර්තෘගේ පෙත්සම භාර ගැනීමට හෝ එය විමසීමට ඔවුන්ට බලයක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

වැදගත් ප්‍රශ්නයක් විශාල ලෙස ඉස්මතු වන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 132 ව්‍යවස්ථාව ප්‍රකාරව කර්තෘ විසින් 2012.1.18 දිනැතිව ඉදිරිපත් කරන ලද මූලික අයදුම්පත මගින්, පස් පුද්ගල විනිසුරු මඩුල්ලක් මගින් 2011.10.24 දින සිදු කල විශේෂ නිශ්චය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123(3) ව්‍යවස්ථාව අනුව ප්‍රමාද දෝෂයකින් සහ / හෝ අන්‍යොන්‍ය වශයෙන් බලය ඉක්මවන පදනම මත, නැවත සමාලෝචනයට සහ පරීක්ෂණයක් සිදු කිරීමට, එය උපරිම ලෙස වැදගත්වන පොදු සහ මහජන වැදගත්කමක්ව තිබියදී, කර්තෘගේ එම අයැදුමට, විනිසුරු ශිරාණි බණ්ඩාරනායක විසින් අවස්ථාව ලබා නොදීමය.

ඉහත සඳහන් කල නඩු නිමිත්තට වඩා ඉතාමත් හාත්පසින්ම වෙනස් ඉඳුරාම පෞද්ගලික නඩු නිමිත්තක් මත ඊට පෙර 2009 අගෝස්තු මාසයේ දී ශ්‍රේෂ්ඨාධිකරණයේ සත් පුද්ගල විනිසුරු මඩුල්ලක් ස්ථාපිත කොට, ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ඉල්ලීමක් මත, පී. බී. ජයසුන්දරව නැවත වරක් මුදල් අමාත්‍යාංශයේ සහ භාණ්ඩාගාරයේ ලේකම් ලෙස පත් කරන ලෙසට පී. බී. ජයසුන්දර විසින් කරන ලද අයැදුම සීග්‍රව විනිශ්චයට භාජනය කොට තීන්දුවක් ලබා දීමෙන් එම පත්වීම නැවත ඔහුට ලබා දීමට කටයුතු සලස්වන ලදී.

2011.4.8 දිනැති ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාවේ '2010 මානව හිමිකම් වාර්තාව: ශ්‍රී ලංකාව' හි පිටු අංක 25 සහ 26 දරණ පිටුවල පහත දැක්වෙන අදාල''උධෘත'' පෙන්වා ඇත:

**"වගන්තිය 4 : නිල දූෂණ හා රජයේ විනිවිදභාවය"**

"නීතිය නිල දූෂණ සඳහා අපරාධ දඬුවම් පහර සපයයි; කෙසේ වෙතත්, රජය විසින් සාර්ථක ලෙස නීතිය ක්‍රියාත්මක නොකල අතර, සහ රජයේ අංශ තුනෙහිම නිලධාරීන් දඬුවම් නොලබා නිතර දූෂණයට සම්බන්ධ වී ඇත... .. ""

"කොළඹ වරාය පුළුල් කිරීම සඳහා විශාල කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීමේදී එවකට භාණ්ඩාගාර ලේකම් පී. බී. ජයසුන්දර විසින් නියමිත පටිපාටිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වරදකරු බව, 2008 වර්ෂයේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සොයා ගන්නා ලදී. ඔහු භාණ්ඩාගාරයේ තනතුරු දැරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තහනම් කරන ලදී. 2009 ජුනි මාසයේදී, ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් නව අග විනිසුරුවරයකු නම් කිරීමෙන් අනතුරුව, ජයසුන්දරහට මුල් තීරණයට විරෝධය පාමින් අධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් ඉදිරියට කරගෙන යාම සඳහා අවසර ලබා දෙන ලදී. පසුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පෙර තීරණය උඩුයටිකුරු කරමින්, ජයසුන්දර මහතා භාණ්ඩාගාරයේ ලේකම් ලෙස නැවත ස්ථාපිත කිරීමට අවසර ලබා දෙන ලදී."

එවිගසම 2012.2.9 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රි පුද්ගල විනිසුරු මඬුල්ල ඉදිරියේ විභාග කිරීමෙන් පසුව, කර්තෘ විසින් ඊළඟ දිනයේදීම එනම් 2012.2.10 වන දින ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පුළුල් සටහන් ඉදිරිපත් කර තිබුණේ, ඔහු විසින් මිට පෙර දින එනම් 2012.2.9 වන දින ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඉදිරිපත් කල සම්පූර්ණ කාර්ය සටහන් ලේඛන ගත කරමින් සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ සම්පූර්ණ ක්‍රියාදාමයම සඳහන් කරමිනි.

***කර්තෘ පොත සම්බන්ධයෙන්–***




***Amazon Books–*** [***'Politics, Justice & the 'Rule of Law'***]

ඒ අනුව, කර්තෘ විසින් 2012.5.8 වන දින වැඩිදුර පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර, ඉහත කී කර්තෘ විසින් සකස් කල ලේඛනගත සටහන් සහ රහස්‍ය ලිඛිත ඉදිරිපත් කිරීම්ද ඇතුළුව අනෙකුත් සියලු සටහන් සහ ලිඛිත ඉදිරිපත් කිරීම් ඒ සමඟ අමුණමින්, ඉහත කී ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව නැවත සමාලෝචනය කිරීමට සහ පරික්ෂා කිරීමට අයදුම් කර තිබුණේ, කලින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ලිපිගොනුවෙන් ඉවත් කල එම ලේඛනද නැවත ඇතුලත් කරමිනි.

කර්තෘ විසින් නැවත සමාලෝචනය කිරීම සහ නැවත විභාග කිරීම සඳහා කල එවැනි අයැදුම, මුලසුන හෙබවූ විනිසුරු එන්. ජී.අමරතුංග විසින් භාර ගැනීමට නොහැකි බව, ඔහුගේ නිල කුටියේදී ප්‍රකාශ කරමින් පහත සඳහන් පරිදි සටහන් තබන ලදී:

> "ශ්‍රේෂ්ඨාධිකරණ ලේඛකාධිකාරී
>
> මෙම අයැදුම 2012/02/09 වන දින ඉවත් කර ඇත. ඉවත් කරනු ලැබූ අයැදුමකට අදාළව මෝසම් / අයැදුම් භාර ගත නොහැකිය.
>
> අත්සන් කලේ.
>
> 2012/05/14"

මේ අතර තුරදී, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක චමල් රාජපක්ෂ විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සියලු දේශපාලන පක්ෂ නායකයින් ගේ උපදෙස් සහ අනුමැතිය ලබාගනිමින්, 2012.10.9 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේ ලබා දුන් විශේෂ නිශ්චයන්ට අදාලව රීති නියමයන් නිකුත් කරන ලදී.



HON. CHAMAL RAJAPAKSA
Speaker, Parliament of Sri Lanka
RULING GIVEN ON 9TH OCTOBER 2012

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායකගේ එකී රීති නියමයෙන් නිගමනය වී තිබුණේ, ශ්‍රේෂ්ඨාධිකරණයට විශේෂ නිශ්චයන් නැවත පරික්ෂා කොට අවශ්‍ය නම් එහි නිර්ව්‍යාජභාවය පිළිබඳ වැරදී නිවැරදි කිරීම සම්බන්ධව සළකා බලන්නට බලය ඇති බවත්, එමගින් රටේ පුරවැසියන්ට හිමිවී ඇති අයිතීන් ව්‍යවස්ථාව අනුව බලාත්මක විය යුතු බවත්ය.

ඉහත කී තත්ත්වය මත, කර්තෘ විසින් තීරණයක් ගනු ලැබුවේ උපරිම අතිශයින්ම පොදු සහ මහජන වැදගත්කමක් ඇති කාරණයක් වූ, අන්‍යෝන්‍ය වශයෙන් නීතියේ ආධිපත්‍යයට අනනුකූලව සහ ස්වභාවික යුක්තිය වළක්වාලමින් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කරමින්, ලබා දුන් 2011.10.24 දිනැති විශේෂ නිශ්චය නැවත සමාලෝචනය සහ පරික්ෂා කිරීමටය.

ඒ අනුව, පාර්ලිමේන්තු කථානායකවරයා ඉදිරිපත් කල රීති නියමය මත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 132 ව්‍යවස්ථාව අනුව කර්තෘ විසින් 2012.10.18 වන දින අයදුම්පතක් ඉදිරිපත් කරමින්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2011.10.24 දිනැතිව ලබා දුන් විශේෂ නිශ්චය තව දුරටත් නැවත සමාලෝචනය කිරීම සහ පරික්ෂා කිරීම සඳහා සහ එම ඉල්ලීම තහවුරු කිරීමට දිනයක් ඉල්ලා සිට ඇත.

එනමුත්, ඊට ආනුෂංගිකව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් විසින් මේ සම්බන්ධයෙන් කරන ලද ලිඛිත සටහන් අනුව, විශේෂ නිශ්චයන් පිළිබඳව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායකගේ රීති නියමයද නොසලකා හැර සහ ඒ පිළිබඳව සඳහනක්වත් සිදු නොකරමින්, පහත දැක්වෙන පරිදි ලිඛිත සටහන් තබා ඇත. - *එනම්:*

*"<u>ගරු. කේ. ශ්‍රී පවන්, විනිසුරු</u>*

පෙත්සම්කරු විසින් 2012.10.18 දිනැතිව මෝසමක් පහත ලේඛන සමඟ ගොනු කර ඇත. :

1. පෙත්සම සහ උප ලේඛන **"එක්ස්", "වයි"** සහ **"ඉසෙඩ්"**
2. ලේඛන
3. දිවුරුම් ප්‍රකාශය
4. "එක්ස්" හි අන්තර්ගත කරුණු සඳහා සහාය පිණිස විශේෂ දිවුරුම් ප්‍රකාශය

2011.10.24 දිනැතිව සිදු කරනු ලැබූ නිශ්චය නැවත සමාලෝචනය කිරිම සහ පරික්ෂා කිරීම සඳහා මෙම අයැදුම 2012 නොවැම්බර් මස 16, 19 සහ 20 වන දින විභාග කිරීමට ගත හැකි බව ඔබගේ ගරු අධිකරණය වෙත තවදුරටත් දන්වා සිටිමි. ඔබගේ ගරු අධිකරණයේ උපදෙස් සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

ශ්‍රේෂ්ඨාධිකරණ ලේඛකාධිකාරී
2012.10.19

<u>ගරු. අගවිනිසුරු</u>

පෙත්සම්කරුගේ 2012.10.18 දිනැති මෝසම මගින්, 2011.10.24 දිනැති විශේෂ නිශ්චය නැවත සමාලෝචනය කිරීම සහ පරික්ෂා කිරීම අපේක්ෂා කරයි. පෙත්සමෙහි 9 (එච්) ඡේදය ප්‍රකාරව, ගරු. කථානායක විසින් 2011.11.11 වන දිනැතිව පනත් කෙටුම්පත සහතික කර ඇත. සහතික කිරීම අනුමත කිරීමෙන් පසුව පනත් කෙටුම්පත නීතියක් බවට පත්වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 (3) ව්‍යවස්ථාවෙහි විධිවිධාන ප්‍රකාරව, එවැනි පනතක වලංගුභාවය පිළිබඳව එයින් පසුව කුමන ස්වභාවයකදීවත් ප්‍රශ්න කිරීම සිදු කල නොහැකිය.

මෙම ව්‍යවස්ථාව (ව්‍යවස්ථාව 80 (3)) එහි සත්‍ය අරමුණ මත නිරූපණය විය යුතු සහ එහි ස්වභාවික අභිප්‍රාය තුල වාග් ශෛලිය මගින් හෙලිවන ලෙස සාකච්ඡා කල යුතුය.

කිසියම් පාර්ශවයක් විසින්, විනිසුරු මඩුල්ලේ සාමාජිකයකුට එරෙහිව “අධිකරණ පක්ෂපාතිත්වය සහ නුසුදුසුකම"යන්න දකින්නේ නම්, එවැනි පාර්ශවයක් විසින්, පනත් කෙටුම්පත විභාගය සඳහා කැඳවූ අවස්ථාවේ දී සිය විරෝධතාවය මතු කර තිබිය යුතුය. පෙර අවස්ථාවේදී විරෝධතාවයක් මතු වී නොමැති නම්, නැඹුරුව පිළිබඳ සැබ අනතුරක් මතු කර දැක්වීමට, හෙලි වන කරුණු පිළිබඳ පැමිණිලි කිරීමට එම පාර්ශවයන්ට නොහැකිය. මනා පදනමකින් තොරව, ඉතා දිගු කලකට පසුව ගන්නා ඕනෑම නිස්සාර විරෝධයක් යුක්තිය නිසා පරිපාලනය බාධා පමුණුවනවා පමණක් නොව, අධිකරණ කටයුතු පහත හෙලීමට කටයුතු කරයි. (අවධාරණය කර ඇත.)

ඉහත සඳහන් කරුණු අනුව, 2012.10.18 දිනැති මෝසම සළකා බැලීම සඳහා කිසිදු නීතිමය පදනමක් මා නොදකිමි. මෝසම ආරම්භයේදීම ප්‍රතික්ෂේප විය යුතුය.

අත්. කලේ. ශ්‍රී පවන්, විනිසුරු
2012.10.22

<u>ගරු. අමරතුංග, විනිසුරු, ගරු. රත්නායක, ජනාධිපති නීතිඥ, ගරු. ඒකනායක, විනිසුරු</u>

විනිසුරු ගරු. ශ්‍රී පවන්ගේ නිරීක්ෂණයන් සමඟ මා එකඟ වෙමි. ප්‍රශ්නගත පනත් කෙටුම්පත 2011.10.24 දිනැතිව අධිකරණය මගින් සළකා බලනු ලැබ සහ ගරු. කථානායක විසින් 2011.11.11 දිනැතිව සහතික කිරීමට කටයුතු කරනු ලැබ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 (3) ව්‍යවස්ථාවෙහි විධිවිධාන ප්‍රකාරව, එවැනි පනතක වලංගුභාවය පිළිබඳව එයින් පසුව කුමන ස්වභාවයකදීවත් ප්‍රශ්න කිරීම සිදු කල නොහැකිය.

මෙම කරුණ 2011.10.24 දිනැතිව විභාග කිරීමේදී එය සිදු කල විනිසුරුවරුන් තිදෙනාගෙන් කිසිම අයෙකුට මේ සම්බන්ධයෙන් විරෝධතාවයක් මතු කර දක්වා නොමැත. ඉහත සඳහන් හේතු මත, 2012.10.18 දිනැති මෝසම ආරම්භයේදීම ප්‍රතික්ෂේප කල යුතුය. කරුණාකර එකී මෝසම සළකා බලා ඔබගේ නිරීක්ෂණයන් / එකඟතාවයන් ලබා දෙන්න.

අත්. කලේ. අගවිනිසුරු

2012.10.23

<u>ගරු. අගවිනිසුරු</u>

ඉහතින් සඳහන් කරන ලද ඔබගේ සහ විනිසුරු ශ්‍රී පවන්ගේ නිරීක්ෂණයන් සමඟ මා එකඟ වෙමි. 2012.10.18 දිනැති මෝසම සළකා බැලීම සඳහා කිසිදු නීතිමය පදනමක් මනොමැති බැවින් මෝසම ආරම්භයේදීම ප්‍රතික්ෂේප විය යුතුය . මෙම කරුණ සම්බන්ධයෙන් වෙනත් කිසිදු මෝසමක් / අයැදුමක් / පෙත්සමක් තවදුරටත් භාර නොගන්නා ලෙසට ශ්‍රේෂ්ඨාධිකරණයේ ලේඛකාධිකාරී වෙත උපදෙස් ලබා දිය යුතුය.

අත්. කලේ. අමරතුංග, විනිසුරු

2012.10.24

<u>ගරු. අගවිනිසුරු</u>

ඔබගේ, විනිසුරු අමරතුංගගේ සහ විනිසුරු ශ්‍රී පවන්ගේ නිරීක්ෂණයන් සහ නිර්දේශයන් සමඟ මා එකඟ වෙමි.

අත්. කලේ. පී. ඒ. රත්නායක, විනිසුරු

2012.10.24

<u>ගරු. අග විනිසුරු</u>

2012/10/23 දිනැති ඔබගේ නියෝගය, 2012/10/24 දිනැති ගරු. විනිසුරු අමරතුංගගේ නියෝගය, 2012/10/22 දිනැති ගරු. විනිසුරු ශ්‍රී පවන්ගේ නියෝගය, සහ 2012/10/25 දිනැති ගරු. විනිසුරු පී. ඒ. රත්නායකගේ නියෝගය අනුව වන නිරීක්ෂණ සහ මූර්තිමත් උපදෙස් සමඟ මා එකඟ වෙමි.

අත්. කලේ. ඒකනායක, විනිසුරු

2012.11.7

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 132 ව්‍යවස්ථාව අනුව, කර්තෘගේ එම අයදුම්පත මත නැවත සමාලෝචනය කිරීම සහ පරීක්ෂණයක් සිදු කිරීම පිළිබඳව සලකා බලා තීරණය කල යුතුව තිබුණේ අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක මිස, වෙනත් විනිසුරුවරයෙකු නොවන්නේය.

කුතුහලයක් ඇති වන්නේ, ලැයිස්තුගත කරන විනිසුරු කේ. ශ්‍රී පවන් විසින් අග විනිසුරුවරිය වෙත එම අයැදුම් පත අවශ්‍ය පරිදි යැවීමට පෙර, එම ව්‍යවස්ථාපිත අධිකරණ විධානයට අනුව ක්‍රියා නොකරමින්, ඔහු විසින්ම ඒ පිළිබඳව කර්තෘගේ එම අයැදුමට ක්‍රියා කරමින්, ඔහුගේම මතය සටහන් කර ඇත. එසේ සිදු කිරීමේදී විනිසුරු කේ. ශ්‍රී පවන් ඒකපාර්ශවිකව ඔහුගේ නිල කුටියේ තනියම සිට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 (3) ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කර ඇති අතර, නමුත් එය එසේ අර්ථ නිරූපණය කිරීම සිදු විය යුතුව තිබුණේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පුළුල් විනිසුරු මඬුල්ලක් විසින් මහජන විමසීමක් සිදු කිරීමෙනි.

විනිසුරු කේ. ශ්‍රී පවන් ඔහු විසින්ම බරපතල ලෙස නොමඟ යාමෙන් තවත් සටහනක් කර තිබුණේ පිළිඹිබු වන 'අධිකරණ පක්ෂපාතීත්වය සහ නුසුදුසුකම' කරුණ කර්තෘ විසින් පෙන්වා දී ඇත්තේ දිගු කලකට පසුව බව ප්‍රකාශ කරමින්, එම නිසා පළමු අවස්ථාවේදීම මේ තර්කය කලින් විනිසුරු එන්. ජී. අමරතුංග හෙබවූ ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රි පුද්ගල විනිසුරු මඬුල්ල ඉදිරියේ 2012.2.9 වන දින මතු කර සිටීම පිළිබඳ කරුණු වෙත ඔහුගේ මනස යොමු නොකර තිබුණි. !

විනිසුරු කේ. ශ්‍රී පවන් කර්තෘගේ එම පිළිඹිබුවන 'අධිකරණ පක්ෂපාතීත්වය සහ නුසුදුසුකම' විහිළුවක් ලෙස අවමන් කරමින් සටහන් කිරීමෙන් පසු, ඊට හාත්පසින්ම වෙනස් ආකාරයකට ඊට දින කිහිපයකට පසුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 117 දෙනෙකුගේ අත්සනින් යුතුව, අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායකට එරෙහිව ඉදිරිපත් කල දෝෂාභියෝග මෝසමක් පාර්ලිමේන්තු කතානායකවරයා විසින් 2012.11.1 දින භාර ගෙන තිබුණි. එහි එක් චෝදනාවක් වී තිබුණේ කර්තෘ විසින්ම ඉදිරිපත් කර තිබූ ඇයගේ ඉහත කී පිළිඹිබුවන 'අධිකරණ පක්ෂපාතීත්වය සහ නුසුදුසුකම' යන්නයි.



THE ISLAND - Thursday 6th November, 2012

Impeachment of CJ: An effort to preserve arbitrary rule

Science and Technology Minister Pavithra Wanniarachchi and Deputy Housing Minister Lasantha Alagiyawanna handing over the impeachment motion against Chief Justice Dr. Shirani Bandaranayake, to Speaker Chamal Rajapaksa at the Speaker's official residence. UPFA MPs Arundika Fernando, Shantha Bandara and Mrs Sudarshini Fernandopulle look on. (Pic. Courtesy Speaker's Office)

dangerous one, is its 'pseudo-populist' nature. It is a farce. It is on that basis that the Opposition to the Supreme Court and its determination on the Divineguma Bill was mustered within Parliament and outside. This is the most dangerous trend.

Those who are blind to populist rhetoric and who cannot distinguish between what is in letter and what is intended, even the Supreme Court decision on the Divineguma bill might appear 'not correct' even though they may like to 'defend devolution' like a pet dog. They even might stumble when the real challenge comes in abolishing the 13th Amendment and the provincial council system. When that comes, in addition to populism, it would be 'patriotism' against foreign interference or imperialism. Even the 'moderate' left in Parliament cannot be completely relied on, on the issue of the 13th Amendment.

විනිසුරු කේ. ශ්‍රී පවන්ගේ නොමඟ ගිය ඒකපාර්ශවික මතය හා තීරණ මත, අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක, පසුව ඇය විසින්ම සටහනක් මගින් එයට එකඟත්වය පළකර ඇත. එනමුත් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 132 ව්‍යවස්ථාව අනුව, එසේ මතයක් ප්‍රකාශ කිරීමේ තනි අයිතිය සහ අනන්‍ය තත්වය අයත් වන්නේ අග විනිසුරුට මිස අන් අයෙකුට නොවන්නේය.

විනිසුරු කේ. ශ්‍රී පවන්ගේ ඉහත කී පිළිඹිබු වන 'අධිකරණ පක්ෂපාතීත්වය සහ නුසුදුසුකම' විහිළුවක් සේ සටහන් කිරීම සම්බන්ධයෙන් අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක විසින් එකඟ නොවී, එය ඇය පිළිබඳව කරුණක් බැවින්, ඇය විසින්ම එය සලකා බලා ඒ අනුව කටයුතු කිරීමට බැඳී සිටියාය.!

විනිසුරු කේ. ශ්‍රී පවන්ගේ ඉහත කී පිළිඹිබු වන 'අධිකරණ පක්ෂපාතීත්වය සහ නුසුදුසුකම' විහිළුවක්සේ සටහන් කිරීම සම්බන්ධයෙන් විනිසුරු පී. ඒ. රත්නායක විසින් එකඟ නොවී, එය ඔහු පිළිබඳව බැවින්, ඔහු විසින්ම එය සලකා බලා ඒ අනුව කටයුතු කිරීමට බැඳී සිටියේය !

විනිසුරු කේ. ශ්‍රී පවන්ගේ ඉහත කී පිළිඹිබු වන'අධිකරණ පක්ෂපාතීත්වය සහ නුසුදුසුකම' විහිළුවක්සේ සටහන් කිරීම සම්බන්ධයෙන් විනිසුරු චන්ද්‍රා ඒකනායක විසින් එකඟ නොවී, එය ඇය පිළිබඳව බැවින්, ඇය විසින්ම එය සලකා බලා ඒ අනුව කටයුතු කිරීමට බැඳී සිටියාය.!

සැලකිය යුතු වන්නේ, විනිසුරු එන්. ජී. අමරතුංග විසින් ඉහත කී කර්තෘගේ පෙත්සමේ අඩංගු කාරණා ප්‍රතික්ෂේප කිරීම සහ / හෝ එයට විරුද්ධ වීම සිදු නොකර සිටීමයි. එනම්, විශේෂයෙන්ම කර්තෘ විසින් අනාවරණය කල සම්ප්‍රකාශයන් සම්බන්ධයෙන්, කලින් විනිසුරු එන්. ජී. අමරතුංගගේ ප්‍රධානත්වයෙන් පැවති ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රි පුද්ගල විනිසුරු මඬුල්ලට, අග විනිසුරු ශිරාණි බණ්ඩාරනායක විසින් කලින්ම නියෝග කර තිබූ බවට ප්‍රකාශ වූ - 'කර්තෘට තර්ක ඉදිරිපත් කිරීමට පමණක් අවස්ථාව ලබා දිය යුතු බවත්, නමුත් මෙම නඩු නිමිත්ත ඉදිරියට ගෙන යාමට ඔහුට අවසරය නොදෙන ලෙසත්' යන්න එහි අඩංගු වී තිබීමය !



CEYLON TODAY

Monday 29 October 2012 www.ceylontoday.lk Price : Rs 20.00 | Vol: 01/294

# CJ on the spot

**A group of MPs contemplating impeachment**

**Cite bribery case against CJ's husband as reason**

By Daya Perera and J.T. de Silva

A group of government Parliamentarians is preparing to move an impeachment motion against Chief Justice, Dr. Shirani Bandaranayake, in Parliament in the near future.

This situation has arisen subsequent to the Commission to Investigate Allegations of Bribery or Corruption (CIABOC) filing charges against Pradeep Kariyawasam, for purchasing shares of a loss-making company at a high rate, while serving as the Chairman of the National Savings Bank (NSB).

The aforesaid group is of the opinion that since the CJ is Kariyawasam's spouse, it is unethical for her to remain in her position.

The group claimed that if the CJ does not resign willingly, they will be forced to move an impeachment against her, in order to protect the independence of the judiciary.

See page 02

**GOVT. SCARED OF CJ – NLS**

By Amila Jayasinghe

The National Lawyers' Society (NLS) accused the government of attempting to bring an impeachment motion against Chief Justice (CJ), Dr. Shirani Bandaranayake.

President of the NLS, Upul Jayasuriya, alleged the government is scared because the CJ would not bow down to President Mahinda Rajapaksa.

See page 02

# සාරාංශය

වර්ෂ 2012 නොවැම්බර් සිට 2013 ජනවාරි දක්වා කාලයේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත ව්‍යවස්ථාවන් සහ ඊට අනුකූලව පවතින ක්‍රියා පටිපාටි යටතේ, ශ්‍රී ලංකාවේ අගවිනිසුරු ආචාර්ය ශිරාණි බණ්ඩාරනායක මහත්මියට එරෙහිව වූ දෝෂාභියෝගය පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් මහජන මතභේද වේගවත් විය. වෙනත් රටවල ප්‍රායෝගික තත්වයන්ට සාපේක්ෂව ප්‍රශ්න මතු කරමින් සහ එක්සත් ජාතීන්ගේ අධිකරණ චර්යාව පිළිබඳ බැංගලෝර් මූලධර්ම සහ ලැටිමර් හවුස් ප්‍රතිපත්ති පරිශීලනය කරමින්, දේශීය හා ජාත්‍යන්තර ආයතන, නියෝජිතායතන සහ සංවිධානයන් මගින් වූ එවැනි මතභේද වේගවත් විය. එකී කරුණ සම්බන්ධයෙන්, මා විසින් අගවිනිසුරු ආචාර්ය ශිරාණි බණ්ඩාරනායක මහත්මියට එරෙහි දෝෂාභියෝගයට ප්‍රසිද්ධියේ සහාය පල කරන බවට සහ එය යුක්ත  සහගත බවට, ඒ සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශයේ අන්තර්ගත කරුණු සහ හේතු සහිතව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු කථානායක වෙත දිවුරුම් ප්‍රකාශයක් සහ ලිපියක් යොමු කරන ලදී. මාගේ එම ස්ථාවරය පිළිබඳව, මහජනයා අතර සහ මාධ්‍ය හරහා මතු කළා පමණක් නොව, අනෙකුත් කරුණු අතරතුර, ජාත්‍යන්තර ආයතන, නියෝජිතායතන සහ සංවිධානයන් හරහා නියෝජනය වෙමින් ඒ සඳහා සාධක ඉදිරිපත් කිරීමට කටයුතු කළෙමි. ඉන් අනතුරුව, මා විසින් දැනුවත් වූ පරිදි, එවැනි එක් කණ්ඩායමක්, එනම් එංගලන්තය සහ වේල්ස්හි මානව හිමිකම් නීතිඥ කාරක සභාව විසින් එක්සත් රාජධානියේ ජෙෆ්රි රොබට්සන් කිව්. සී. වෙනුවෙන්, ඔහු මාගේ නියෝජනයන් සමඟ කටයුතු කිරීමෙන් තොරව, ලබා දී ඇති තර්ජනාත්මක අනතුරු වාර්තාව බලපතල ගැටුම් ඇති කිරීමේ ඔහුගේ උනන්දුව අනාවරණය නොවීම හේතුවෙන්, විශ්වාසය තැබිය නොහැකි වූ අතර අපකීර්තියට පත්විය.

## 2012 දී ශ්‍රී ලංකාවේ අගවිනිසුරුවරිය

## දෝෂාභියෝගයට ලක් කිරීම සඳහා සහයෝගය දැක්වීම යුක්ති සහගත වීම

## නිහාල් ශ්‍රී අමරසේකර

සම්මානනිය වරලත් ගණකාධිකාරි
සම්මානනිය වරලත් කළමණාකරණ ගණකාධිකාරි
සම්මානනිය වරලත් කළමණාකරණ ගණකාධිකාරි
වරලත් ගෝලිය කළමණාකරණ ගණකාධිකාරි
සහතිකලත් වංචා පරික්ෂක
ඇමරිකානු නිතිඥවරුන්ගේ සංගමයේ සහයක
දුෂණ විරෝධි බලධාරින්ගේ ජාත්‍යාන්තර සංගමයේ සම්බන්ධීකාරක
රාජ්‍ය මුල්‍ය කාළමණාකාරිත්වය පිළිබඳ ජාත්‍යාන්තර සන්ධානයේ හිටපු මණ්ඩල සාමාජික

**කෙටි තාවකාලික විදෙස්ගත වීමකින් අනතුරුව ශ්‍රී ලංකාවට ආපසු පැමිණි කල්හි,"ඌන ක්‍රියාකාරි ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය පනත" පැනවීම සඳහා රජය විසින් කඩිමුඩියේ 'හදිසි පනත් කෙටුම්පතක්' ඉදිරිපත් කර තිබුණ බව මට දැනගන්නට ලැබුනි. 2011 නොවැම්බර් 8 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණ පනත් කෙටුම්පත 2011 නොවැම්බර් 9 වන දින සම්මත කරනු ලැබ, ගරු කථානායකතුමා විසින් එය 2011 නොවැම්බර් 11 වන දින සහතික කර තිබුණේ වී නමුත්, ඔහු විසින් ඒ බවට පාර්ලිමේන්තුවේදි ප්‍රකාශයක් කරන ලද්දේ 2011 නොවැම්බර් 22 වන දිනදී පමණකි.**(*Google Books – 'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'*)

**එවැනි හදිසි පනත් කෙටුම්පත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකුල වන්නේ දැයි යන්න පිළිබඳව පැය 24 ක් ඇතුලත හෝ දින 3 ක් ඉක්මවා යෑමට පෙරාතුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ තිරණයක් සදහා,එය 'ජාතික හිත පිණිස' සඳහා "හදිසි" වන බවට කැබිනට් ආමාත්‍ය මණ්ඩලය විසින් සහතික කළ කල්හි,ජනාධිපති විසින් අගවිනිසුරුවරයා වෙත යොමු කිරීම සහිතව, නීතියක් හදිසියේ පැනවීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාවෙන් ඉඩ සලසා ඇත.**

**අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් 2011 ඔක්තෝබර් 19 දින “හදිසි” ලෙස සහතික කර ඇති ඉහත කී මෙම පනත් කෙටුම්පත, ශිරාණි බණ්ඩාරනායක අගවිනිසුරුතුමිය වෙත 2011 ඔක්තෝබර් 21 සිකුරාදා දින ලැබ, එමගින් බලපාන්නාවූ පාර්ශවයකට මොණයම් අකාරයකවත් කිසිදු දැනුම් දීමකින් තොරව, ගරු නීතිපතිතුමා වෙත පමණක් දැනුම් දීමක් කර, සති අන්තය ඉක්මවූ සැනින් ලැයිස්තු ගත කර, 2011 ඔක්තෝබර් 24 සඳුදා දිනම ඇය විසින් මුලසුන දැරූ විනිසුරු පී. ඒ. රත්නායක සහ සී. ඒකනායක විනිසුරුවරිය ඇතුළත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලක් අභියසදී සුවිශේෂීව ඇසීමට නියම කර ගෙන, ඔවුන් විසින් කරන ලද 2011 ඔක්තෝබර් 24 දිනැති විශේෂ තීරණය, 2011 නොවැම්බර් 9 දින ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. එනයින් 2011 ඔක්තොබර් 24 සඳුදා දින එම ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇසීමේදී පෙනී සිටීමට, එය බලපෑ කිසිදු පාර්ශවයකට කිසිසේත්ම කළ නොහැක්කක් විය.**(*Google Books – ‘Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law’*)

**එම අවස්ථාව නැතැයි කී පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව ප්‍රකාර පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකුලත්වය පිළිබඳව සතියක් ඇතුළත අභියෝගයට ලක් කිරීමට මොනයම් හෝ පුරවැසියකුට හිමිකමක් ඇති අතර, කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් ‘‘ජාතියේ හිත පිණිස’’ යයි සළකනු ලබන “හදිසි පනත් කෙටුම්පතක්” සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 ව්‍යවස්ථාව ප්‍රකාර, ඒ පනත් කෙටුම්පත හෝ පනත් කෙටුම්පතේ යම් විධිවිධානයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල ද යන වග ශ්‍රේෂ්ඨාධිකරණය පළකළහොත්, ඒ පිළිබඳ විශේෂ තීරණයකින් දැනගැනීමට ජනාධිපතිවරයාට එම කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුට යොමු කළහැක. එය මෙසේය:**

**හදිසි පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය විශේෂයෙන් ක්‍රියාත්මක කිරීම.**

**122.** (1) අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව ජාතියේ හිත පිණිස වහා අවශ්‍ය වන්නා වූ ද ඒ බවට අමාත්‍ය මණ්ඩලයේ ලේකම් වරයාගේ අත්සන ඇති සටහනක් දරන්නා වූ ද පනත් කෙටුම් පතක් සම්බන්ධයෙන්-

(අ) මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව 78 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන සහ 121 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදළ නොවන්නේ ය.

(ආ) ඒ පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ද යන්න පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ තීරණය අග්‍ර විනිශ්වයකාරවරයා අමතා යවන ලිඛිත යොමු කිරීමක් මගින් ජනාධිපතිවරයා විසින් ඉල්ලා සිටිය යුත්තේ ය. ඒ යොමු කිරීමේ පිටපතක් ඒ අවස්ථාවේ දී ම කථානායකවරයා වෙත භාර දිය යුත්තේ ය.

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණය කැඳවනු ලැබ පැය විසිහතරක් ඇතුළත (හෝ ජනාධිපතිවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි දවස් තුනක් නොඉක්මවන ඊට වැඩි කාලයක් ඇතුළත) ඒ අධිකරණය විසින් ස්වකීය තීරණයට එළඹිය යුත්තේ ය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම තීරණය ජනාධිපතිවරයාට සහ කථානායකවරයාට පමණක් දනුම් දිය යුත්තේ ය.

(2) 121 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ පනත් කෙටුම්පතකට අදාළ වන්නේ ය.

**එසේ හෙයින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් 'හදිසි කෙටුම්පත් පනතක්' පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූලද යන සැකයක් පළ කළහොත්, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123(3) ව්‍යවස්ථාව ප්‍රකාර,ව්‍යවස්ථාවට අනනුකූල යයි තීරණය කරනු ලැබුවාක් සේ සැළකිය යුතුයයි, ගැබ්කොට ඇති ආරක්ෂාවක් සළසා ඇත. එනම්:-**

| | |
|---|---|
| **පනත් .කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධි කරණයේ තීරණය.** | **123.** (3) 122 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි සටහනක් කරන ලද පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් වූ විට, ඒ පනත් කෙටුම්පත හෝ පනත් කෙටුම්පතේ යම් විධිවිධානයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල ද යන සැකයක් ශ්‍රේෂ්ඨාධිකරණය පළ කළහොත් ඒ පනත් කෙටුම්පත හෝ පනත් කෙටුම්පතේ එම විධිවිධානය හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල යයි තීරණය කරනු ලැබුවාක් සේ සලකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මේ ව්‍යවස්ථාවේ (1) වන සහ (2) වන අනුව්‍යවස්ථාවල විධිවිධාන අනුව ක්‍රියා කළ යුත්තේ ය. |

**මෙය එසේ යයි තහවුරු වන්නේ, 2015 මැයි 15 දින පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහ නවවන සංශෝධනය මගින් එහි 30 සහ 31 වන ව්‍යවස්ථා මගින්, පිළිවෙලින් 122 සහ 123(3) ව්‍යවස්ථා නැවත බලාත්මක කර ඇති අතර, එමගින් 122 ව්‍යවස්ථාව යටතේ වූ 'හදිසි පනත් කෙටුම්පතක්' ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123(3) ව්‍යවස්ථාව මගින් පාලනය වේ යයි ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සනාථ කර ඇත. එනම්:-**

| | |
|---|---|
| **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 වන ව්‍යවස්ථාව ඉවත් කිරීම.** | **30.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ. |
| **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.** | **31.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123 වන ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව ඉවත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ. |

**එම 'හදිසි පනත් කෙටුම්පත' බලපෑ කිසිදු හෝ පාර්ශවයක් නොමැතිව,** *Amicus Curiae* **(නීතිමය හා කාරණා පිළිබඳව අධිකරණයට සහය දෙනු ලබන්නා - අධිකරණ සහායක) ලෙස ගරු නීතිපති ජනාධිපති නීතිඥ මොහාන් පිරිස් වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයකු විසින් ඒකපාක්ෂික ලෙස ඒවාට පිළිතුරු සැපයීම සහිතව, ඉහත කී 2011 ඔක්තෝබර් 24 දිනැති විශේෂ තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පළකොට ඇත්තාවූ නානා සැකයන්ගෙන් සමන්විතය. එනයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123(3) ව්‍යවස්ථාව ප්‍රකාර ව්‍යවස්ථානුකුල විධිනියෝගයක් පරිදි, එම 'හදිසි පනත් කෙටුම්පත' ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකුල වන ලෙසට තීරණය කරනු ලැබුවා සේ පැවතුනි. අන් අයුරකින් තීරණයක් කිරීමෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ව්‍යවස්ථානුකුලව පරිබාධක වී හා තහනම් වි තිබුනි.**(*Google Books – 'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'*)

**ඇත්ත වශයෙන්ම පැන නැගුනු පුදුම සහගත ප්‍රශ්නයක් වුයේ, "ජාතික ආරක්ෂාව" තහවුරු කිරීමට හැර, පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇත්තාවූ ජාත්‍යන්තර සම්මුති හා ගිවිසුම් උල්ලංඝනය කරමින්, මොනයම් හෝ නීතියක් පැනවීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 ව්‍යවස්ථාවෙන් තහනම් කර තිබියදී, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එසේ කිරීමට ව්‍යවස්ථානුකුලව පරිබාධනය වි තිබුනත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉක්මවා යාමෙන් හෝ බලරහිතව ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය ක්‍රියා කරමින්, 2011 ඔක්තෝබර් 24 දිනැති විශේෂ තීරණය මගින් "ජාතික අරක්ෂාව" වෙනුවට "පොදු අරමුණු" උදෙසා නීතියක් පැනවීමට ඉඩදී තිබුනි.**

**ප්‍රිවි කෞවුන්සලය** (Privy Council) **විසින් මීට පෙර, යම්කිසි නම්කල පුද්ගලයන්ට පමණක් නීතියක් පැනවීම, නීතියට අනනුකූල නොවන සහ වලංගුභාවයක් නොමැති නීතියක් ලෙස ප්‍රතික්ෂේප කළ** *Liyanage and Others V. The Queen [1965] UKPC 1* **නඩුවේ තීන්දුකර තිබුණි. මේ අවස්ථාවේදී ඉහත කී 'හදිසි පනත් කෙටුම්පතෙහි' විනිවිද භාවයකින් අගය කර තේරීමේ පිළිවෙතකින් තොරව, මානව හිමිකම් උල්ලංඝනය කරමින් හා බලපෑ මොනයම් පාර්ශවයකට හෝ දැනුම් දීමකින් තොරව, ඔවුනට ස්වභාවික යුක්තිය අහිමි කරමින්, පුද්ගලික ආයතන ඒකක 36 ක් "ඌණ උපයෝගිතා" යනුවෙන් සහ එය ප්‍රතිව්‍යුහගත කිරීමට අධිකරණමය බලයේ පිළිසරණ එවකටත් පතා සිටි අතරතුර, සමාගමක් වූ හෝටෙල් ඩිවර්ලෝපර්ස්** PLC **සමාගම "ඌණ ක්‍රියාකාරි" ව්‍යවසායක් වශයෙන්ද රජය සන්තකයට පවරා ගනිමින්, පනත් කෙටුම්පතේ ලැයිස්තුගත කොට තිබුනි. අපූර්වත්වය වන්නේ ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය සහ අනිකුත් විනිසුරු දෙපළ 2011 ඔක්තෝබර් 24 විශේෂ තීරණය ගැනීමෙහිලා යථෝක්ත කාරණය අවධාරණයට ගැනීමට කණගාටුදායක ලෙස අපොහොසත්වීමය.**(*Google Books – ['Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'](#)&Liyanage and Others V. The Queen [1965]*)

**ගරු කථානායක විසින් 2011 නොවැම්බර් 11 දින පනත් කෙටුම්පත සහතික කළ බව** HDL **සමාගමේ ප්‍රවර්ධයකු හා ප්‍රධාන පරදුභාරකරුවකු (**Stakeholder**) වශයෙන් නොදැන සිටි මම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4**(d) **ව්‍යවස්ථාවේ නියමයන් ප්‍රකාර, ශ්‍රේෂ්ඨාධිකරණය බැඳී සිටිනුයේ මූලික අයිතිවාසිකම් පෙත්සම සුරක්ෂිත කොට අභිවර්ධනය කිරීමට විනා, මූලික අයිතිවාසිකම් සංක්ෂිප්ත කිරීමට, සීමා කිරීමට හෝ අහිමි කිරීමට නොවීම කෙරෙහි අචල විශ්වාසයකින් යුතුව, පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින්, මා විසින් 2011 නොවැම්බර් 14 දින දී ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක** SC (FR) **534/ 2011 දරණ මූලික අයිතිවාසිකම් පෙත්සම ඉදිරිපත් කර සිටියෙමි.**

පරමාධිපත්‍යය ක්‍රියාත්මක කිරීම.

4. ජනතාවගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක වීම ද, භුක්ති විඳීම ද, මතු දැක්වෙන ආකාරයෙන් සිදුවන්නේ ය:-

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලබන මූලික අයිතිවාසිකම් සියලු පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුත්තේ ය; ආරක්ෂා කරනු ලැබිය යුත්තේ ය; වර්ධනය කරනු ලැබිය යුත්තේ ය. තව ද, ඒ මූලික අයිතිවාසිකම් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සහ ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම, සීමා කිරීම හෝ අහිමි කිරීම නොකළ යුත්තේ ය;

**මා අසනීපයෙන් පෙළී සිටියදී, මගේ පෙත්සම සමග වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරමින්, සති දෙකක් ඇතුළත මාගේ පෙත්සම තහවුරු කිරීමට පෙනී සිටීමට අවසරය පතා සිටියෙමි. ඊට අමතරව පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් වෙනත් පාර්ශව පහක්ද කලින් පෙත්සම් ඉදිරිපත් කර තිබුනි. මෙම පෙත්සම් ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය විසින් ස්ථාපනය කරනු ලැබූ, විනිසුරුවරු පස් දෙනෙකුගෙන් යුත් විනිසුරු මඩුල්ලක් ඉදිරියේ 2011 නොවැම්බර් 15 දින ඇසීමට ලැයිස්තු ගත කොට තිබුණි. මාගේ වෛද්‍ය සහතිකය පිළිබඳව කිසිදු තැකීමකින් තොරව ඇය විසින් මාගේ පෙත්සමද ඊට පසු දිනයේදීම එනම් 2011 නොවැම්බර් 15 දින ඇසීමට ලැයිස්තුගත කොට තිබුණි. සැලකිය යුතු ලෙස, ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ටාර් තැන මා හට පුද්ගලිකව දුරකථනයෙන් කථා කොට, අධිකරණයේ එම දිනම පෙනී සිටින ලෙසට ආයාචනා කර සිටින ලදී. එසේ කිරීම මම ප්‍රතික්ෂේප කර සිටියෙමි.** (*Amazon Books – ['Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'](#)*)

**මාගේ ඉල්ලීම ප්‍රකාර, ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ටාර් විසින් මාගේ පෙත්සම, වෛද්‍ය සහතිකයද සහිතව අනිකුත් පෙත්සම් ඇසීමට නියමිතව තිබුන පස් දෙනෙකුගෙන් යුතු විනිසුරු මඩුල්ල වෙත ඉදිරිපත් කර තිබුනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80(3) ව්‍යවස්ථාව යටතේ 2011 නොවැම්බර් 11 දින පනත් කෙටුම්පත ගරු කථානායකතුමා විසින් සහතික කරනු ලැබීමෙන්, 2011 නොවැම්බර් 22 දින නිවේදනය කර එය නීතියක් ලෙසින් පැනවී ඇති බැවින්, එය**

**පනතක් බවට පත්වීමෙන් අනතුරුව පනත් කෙටුම්පත අභියෝගයට ලක් කිරීමක් භාර ගැනීමට අධිකරණය අක්‍රියභාවයට පත්වීමෙන් අනිකුත් පෙත්සම් 5 මුල් ආරම්භයේම නිෂ්ප්‍රභා කර සිටින අතරතුර, මාගේ පෙත්සම තහවුරු කරනු පිණිස මට වෙනත් දිනයක් ඉල්ලා සිටීමට, එම විනිසුරු මඩුල්ලේ මූලසුන හෙබවූ එන්. ජී. අමරතුංග විනිසුරුතුමා විසින්, මට අවසරය දෙන ලදී. පනත් කෙටුම්පතක් නීතිගත වූ අවස්ථාවක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80(3) ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණය එම කෙටුම්පතට අභියෝග කිරීම බල රහිත වේ. එය මෙසේයː**

| | |
|---|---|
| පනත් කෙටුම්පතක් නීතිය බවට පත්වීම. | 80. (3) අවස්ථාවෝචිත පරිදි ජනාධිපතිවරයා ගේ හෝ කථානායකවරයාගේ සහතිකය පනත් කෙටුම්පතක් මත සටහන් කරනු ලැබූ පසු එම පනත් කෙටුම්පත නීතිය බවට පත් වන අවස්ථාවක ඒ පනතෙහි වලංගුභාවය පිළිබඳව පරීක්ෂා කිරීම, ඒ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීම කිසිම අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් හෝ විසින් නොකළ යුත්තේ ය. |




**මෙම පනත් කෙටුම්පත ගරු කථානායකතුමා විසින් සහතික කරනු ලැබ ඇති බව ඉහත කී පරිදි නොදැන සිටීමෙන්, 2011 නොවැම්බර් 17 දින මම අංක** SC (SD) **2/2011 දරණ පෙත්සමද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 121 ව්‍යවස්ථාවේ නියමයන් ප්‍රකාර මා විසින් ඉදිරිපත් කර සිටින ලද අතර, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය විසින් ඒ පිළිබඳව – "යම් පාර්ශවයකට මැදිහත් වීමේ අවශ්‍යතාවයක් තිබුනේ නම්, ශ්‍රේෂ්ඨාධිකරණය අභියස පනත් කෙටුම්පත ගත් අවස්ථාවේදී එසේ කළ යුතුව තිබුනි" යනුවෙන් සිය නිල කාමරයේදී සටහන් කරනු ලැබ, එම පෙත්සම ලඝු වශයෙන්ම ප්‍රතික්ෂේප කර සිටින ලදී. ඇය විසින් එසේ කරන ලද්දේ එසේ මැදිහත් වීමකට කිසිවෙකුට කිසිසේත්ම අවකාශයක් නොතිබුණ බව ඇය හොඳාකාරවම දැන සිටියදීය.** (*Google Books – 'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'*)

**කෙසේ නමුදු, ඉහත කී 5 දෙනෙකුගෙන් යුත් විනිසුරු මඩුල්ලේ, එන්. ජී. අමරතුංග විනිසුරුතුමා විසින් මූලසුන හෙබවූ විනිසුරුවරුන් තිදෙනෙකු අභියසදී මාගේ** SC (FR) **534/2011 දරණ මූලික අයිතිවාසිකම් පෙත්සම තහවුරු කර සිටීමට මට අවසරය දී තිබුනි. 2011 නොවැම්බර් 14 දින මාගේ පෙත්සම ගොනු කළ අවස්ථාවේදී පනත් කෙටුම්පත නීතිගත වීමට සහතික කර තිබුනු බව මා නොදැන සිටි බවත්, ඒ බව මට දැන ගැනීමට ලැබුනේ 2011 නොවැම්බර් 22 දින කථානායකතුමා විසින් එය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව බවත්, එම නිසා ඒ කෙටුම්පත අභියෝගයට ලක් කිරීමට මට අයිතියක් නැති බවත් පිළිගනිමින්, මම පතා සිටියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80(3) ව්‍යවස්ථාව යටතේ, 2011 ඔක්තෝබර් 24 දිනැති විශේෂ තීරණය සමාලෝචනය කර නිවැරදි කිරීමක් කිරීමට අයිතියක් තිබෙන බව තහවුරු**

**කරමිනි.** (*Amazon Books – 'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'*)

**ඔක්තෝබර් 24 දිනැති එම තීරණය සමාලෝචනය කොට නිවැරදි කිරීමේ නෛසර්ගික අයිතියක් ශ්‍රේෂ්ඨාධිකරණය සතුව ඇති අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 123(3) ව්‍යවස්ථාවේ විධානත්මක විධි විධානයන් අනුව, එසේ නිවැරදි කරනු ලැබුවහොත්, එවිට කළ යුත්තේ කුමක්දැයි යන්න පිළිබඳව විශේෂ තීරණයකට එළඹීමේ වගකීම ගරු කථානායකතුමා සහ පාර්ලිමේන්තුව සතුව රැදී පවතින බව මම අවධාරණයෙන් යුතුව කියා සිටියෙමි. 2011 නොවැම්බර් 15 දින අනිකුත් කලින් පෙත්සම් 5 නිෂ්ප්‍රභා කළ එන්. ජී. අමරතුංග විනිසුරුතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල මාගේ එම ස්ථාවරය ගැන පැහැදීමක් දක්වමින්, මාගේ පෙත්සම පිළිගෙන වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත් කිරීමට නියම කරමින්, මාගේ ඉල්ලීම ප්‍රකාර 2011 දෙසැම්බර් 16 දින වන විට සංශෝධිත පෙත්සමක් ඉදිරිපත් කිරීමට මට අවසරය දෙන ලද අතර, එය මවිසින් ඉටු කරන ලදී. වගඋත්තරකරුවන්ට නොතීසි නියම කිරීමට උපදෙස් දුන් පරිදි 2012 ජනවාරි 26 දින ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් විසින් නොතීසි නිකුත් කරන ලදී.**(*Google Books – 'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'*)

**මා හට හරියාකාරව සහ නීත්‍යානුකූලව කළ හැකිව තිබුන පරිද්දෙන්, මා විසින් ඉල්ලා සිටින ලද්දේ, 2011 ඔක්තෝබර් 24 දිනැති විශේෂ තීරණය සමාලෝචනය කොට නිවැරදි කිරීමක් කරන ලෙසට වූ බැවින්, තවද විනිසුරු 5 දෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් යුත් විනිසුරු මඩුල්ලක්ද පතමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 132 ව්‍යවස්ථාව යටතේ එවැනි සමාලෝචනයක් සඳහා විනිසුරු මඩුල්ලක් ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය විසින් ස්ථාපනය කිරීම සඳහා ඉල්ලා සිටිමින්, 2012 ජනවාරි 18 දින මවිසින් ඉල්ලීමක් කළෙමි. එනම්:-**

ශ්‍රේෂ්ඨාධිකරණය පැවැත්වීම

132. (1) අග්‍රවිනිශ්චයකාරවරයා අන්‍යාකාර විධාන කළහොත් මිස, ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙන් වෙන් අධිකරණ බලය සාමාන්‍යයෙන් කොළඹ දී ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(2) ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය, වෙන් වෙන්ව නඩු විභාග කරන ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයන් කිහිපදෙනකු විසින් එකම අවස්ථාවේ දී විවිධ කාරණා සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැක්කේ ය :

එසේ වුව ද, සියලු අවස්ථාවල දී එහි අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් ශ්‍රේෂ්ඨාධිකරණය වශයෙන් එක් රැස්ව සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(3) අග්‍රවිනිශ්චයකාරවරයා විසින් -

(i) සිය මෙහෙයවීමෙන් ම ; හෝ

(ii) යම් කාරණයක් විභාග කරන විනිශ්චයකාරවරයන් දෙදෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විට ; හෝ

(iii) යම් අභියාචනයක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් හා සම්බන්ධ ප්‍රශ්නය අග්‍රවිනිශ්චයකාරවරයාගේ මතය අනුව ජනතාව සම්බන්ධයෙන් වැදගත් වන හා පොදු වැදගත්කමක් ඇති ප්‍රශ්නයක් වේ නම්, ඒ අභියාචනයේ, නඩු කටයුත්තේ හෝ කාරණයේ පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට ; හෝ

ඒ අභියාචනය, නඩු කටයුත්ත හෝ කාරණය ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් පස් දෙනකුගෙන් හෝ ඊට වැඩි සංඛ්‍යාවකගෙන් සමන්විත විනිශ්චය පීඨයක් විසින් විභාග කළ යුතු යයි විධාන කළ හැක්කේ ය.

(4) ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව ඒකමතික තීරණයක් නොවන විට, ඒ තීන්දුව බහුතර සංඛ්‍යාවේ තීරණය විය යුත්තේ ය.

කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පරිචය පරිදි සමාලෝචනය සඳහා මා විසින් කළ ඉල්ලීම ඇසීම සඳහා ඇය විසින් මුලසුන හෙබවූ 2011 ඔක්තෝබර් 24 දිනැති විශේෂ තීරණය කළ විනිසුරු මඩුල්ල ස්ථාපනය නොකරමින්, ඊට ප්‍රතිවිරුද්ධ ලෙස 2011 නොවැම්බර් 25 දින මාගේ පෙත්සම පිළිගෙන වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත් කිරීමට නියම කළ එන්. ජී. අමරතුංග විනිසුරුතුමා මුලසුන හෙබ වූ එම විනිසුරු මඩුල්ල විසින්ම 2012 පෙබරවාරි 9 දින මාගේ පෙත්සම ඇසීමට ඇය විසින් නියම කර, වගඋත්තරකරුවන් වෙත දැන්වීම් නිකුත් කරන ලෙසට නියෝග කළේය.

2011 ඔක්තෝබර් 24 දිනැති විශේෂ තීරණය ඒ අයුරින් පැවතීමට නොහැක්කක් වන බව ඉතාමත්ම මැනවින් පිළබිඹුකර ස්ථාපිත කරමින්, කරුණු පැහැදිලි කිරීම් සහිතව, සවිස්තරාත්මක ලිඛිත දේශනද ඉදිරිපත් කරමින්, 2012 පෙබරවාරි 9 දින පැය 1½ කට ආසන්න කාලයක් විස්තරාත්මක ඉදිරිපත් කිරීම් මා විසින් සිදු කරන ලදී. ඒ මන්ද යත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123(3) ව්‍යවස්ථාව ඉහත සඳහන් හදිසි පනත් කෙටුම්පත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල වන බවට නෛසර්ගිකව විධානාත්මක ලෙසින් සැලකෙන බැවින්, අන් අයුරක තීරණයක් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය අක්‍රියව සිටි බව පවසමිනි. සාමිවරුන්ගේ මන්ත්‍රණ සභාවේ (House of Lords), චිලියානු ජනාධිපති පිනෝචේ නඩුව මම උපුටා දක්වා සිටියෙමි. එනම් එක් සාමිවරයෙකුගේ බිරිඳක් මැදිහත් වුන පාර්ශවයක් වූ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් විසින්, හුදෙක් පරිපාලනමය තත්වයක සේවයේ යොදවා ගැනීමේ හේතුව මත, එහි එක් කමිටුවක්, වෙනත් කමිටුවක් විසින් කරන ලද තීරණයක් පූර්ණ ලෙසින්ම ප්‍රතික්ෂේප කරනු ලැබුවේ අධිකරණමය පක්ෂපාතිත්වය මත එම සාමිවරයා නුසුදුස්සකු ලෙසට පිළිඹිබු වූ බව නිගමනය කරමිනි.

ප්‍රත්‍යක්ෂ ලෙසින්ම මාගේ ඉදිරිපත් කිරීමෙහි කුසලතාවය සහ නිවැරදිභාවය පිළිගනිමින්, මුලසුන දැරූ එන්. ජී. අමරතුංග විනිසුරුතුමා මට පවසා සිටියේ, එක්සත් රාජධානියේ එක් විනිසුරු මඩුල්ලක් විසින් කරන ලද තීරණයක් වෙනත් මඩුල්ලක් විසින් සමාලෝචනය කොට ඉවතලෑමට හැකි වුවද, ශ්‍රී ලංකාවේ පරිචය වන්නේ තීරණයක් දුන් විනිසුරු මඩුල්ල විසින්ම එම විශේෂ තීරණය සමාලෝචනය කළ යුතු බවය. එවිට මම ක්ෂණිකවම අවධානය යොමුකර සිටියේ, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය විසින් 2010 ඔක්තෝබර් 24 දින කරන ලද විශේෂ තීරණය පිළිබඳව එබඳු සමාලෝචනයක් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 132 ව්‍යවස්ථාව යටතේ, 2012 ජනවාරි 18 දින කරන ලද මාගේ ඉහත ඉල්ලීම කෙරෙහි සහ එම යථාර්ථ කාරණය ඇය දැන සිටියේ වී නමුත්, සමාලෝචනය සඳහා මාගේ පෙත්සම එන්. ජී. අමරතුංග විනිසුරුතුමා මුලසුන හෙබවූ විනිසුරු මඩුල්ල විසින්ම ඇසිය යුතු ලෙසට, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය විසින්ම විශේෂිත ලෙසින්ම නියම කිරීම කෙරෙහිය.(*Amazon Books– ['Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'](#)*)

එම අවස්ථාවේදී 2012 ජනවාරි 18 දිනැති මාගේ ඉල්ලීම විමසා බැලීමට එන්. ජී. අමරතුංග විනිසුරුවරයා නඩු වාර්තාව පරික්ෂා කර බලන ලදුව, මා සහ පැමිණ සිටි අනිකුත් අයවලුන් විමතියට පත් කරමින්, එන්. ජී. අමරතුංග විනිසුරුතුමා විවෘත අධිකරණයේ වුවමනාවෙන්ම හෝ තැකීමකින් තොරව, එක්වරම ප්‍රකාශකර සිටියේ, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය විසින් ඔවුන්ට විධානය කර තිබුණේ මට සවන් දී සිටින ලෙසට විනා, මාගේ පෙත්සම ඉදිරියට පවත්වා ගෙන යෑමට අවසරය දීමට නොවන බවය. (ගරු රවි කරුණානායක, එවකට පාර්ලිමේන්තුවේ විපක්ෂ සාමාජික, වර්තමාන මුදල් අමාත්‍ය අධිකරණයේ සිටි අතර පැවසූ දෙයට සාක්ෂි දරනු ඇත.) මෙයින් කුතුහලයට තුඩු දෙමින් විශාල ලෙසින්ම විදහා මතුවූ ප්‍රශ්නය වුයේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ වටිනා කාලය නාස්ති කරමින්, දීර්ඝ ලෙස මට මුල් අවස්ථාවේදීම ඉදිරිපත් කිරීම් සිදු කිරීමට ඉඩ හැරියේ මන්දැයි යන්නය? පාර්ශවයකට සවන් දීමෙන් අනතුරුව, කුමන තීරණයක් ගත යුතු දැයි යන්න පිළිබඳව වෙනත් විනිසුරු මඩුල්ලකට විධානයක් දීමේ මොනයම් හෝ අයිතියක් ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය සතු නොවේ. මෙය ඉතාමත්ම ප්‍රත්‍යක්ෂ ලෙසින්ම ඇයගේ පාර්ශවයෙන් වූ බරපතල අධිකරණමය විෂමාචාරයක් නොවුයේද? (*Google Books– ['Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'](#)*)

අපේක්ෂිතයෙන් ඇත් වූ මෙම දැනුම් දීමට මුහුණ පාන්නට සිදුවීමෙන්, ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SC(FR) 209/2007 දරණ පෙත්සම විභාග කිරීමෙන් අනතුරුව, අනෛතික, නීතිවිරෝධී හා වංචනික වුවක් ලෙසට සළකා, 2008 ජුලි මස 21 දින අහෝසි කළ ජෝන් කීල්ස් හෝල්ඩිංස් PLC සමාගම වෙත කළ පෞද්ගලීකරණයක් සම්බන්ධයෙන්, ඔහුගේ කල්ක්‍රියාව හා ක්‍රියාදාමයන් හේතුවෙන් පී.බී. ජයසුන්දර මොන යම් හෝ රාජ්‍ය නිල තනතුරක් දැරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කලින් තහනමකට ලක් කරන ලදුව, මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා ලෙස නැවත නිල තනතුරු දැරීමට අවසරය පතමින් හා කවරදාකවත් සෘජුවම හෝ අනියම් ලෙසින් රාජ්‍ය තනතුරු නොදරන බව දිවුරුම් පතක් මගින් සහතික වීමෙන් නිදහස් කිරීම පතමින්, පී.බී. ජයසුන්දර විසින් 2009 ජුලි 7 දින ඉදිරිපත් කරන ලද (පසුව සංශෝධනය කළ) පෙත්සම පිළිබඳ සඳහන් කරමින්, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියගේ අධිකරණමය පක්ෂපාතිත්වය හා නුසුදුසුකම පිළිබිඹු කර දැක්වෙන සේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු වාර්තාවන්හි උද්දෘතයන් අඩංගු කරමින්, වැඩිදුර පිළියෙල කළ ලිඛිත ඉදිරිපත් කිරීම්, මම එන්. ජී. අමරතුංග විනිසුරුතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල වෙත එම අවස්ථාවේදීම ඉදිරිපත් කර සිටියෙමි.(*Amazon Books– ['Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'](#)*)

පී. බී. ජයසුන්දරගේ ඉහත අයැදුම 2009 සැප්තැම්බර් 24 දින අග විනිසුරු ජේ. ඒ. එන්. ද සිල්වා සහ ශිරාණි බණ්ඩාරනායක, ශිරාණි තිලකවර්ධන, ඩී. ජේ. ද එස්. බාලපටබැඳි, එස්. මර්සූෆ්, කේ. ශ්‍රීපවන් සහ පී. ඒ. රත්නායක යන විනිසුරුවරු 7 දෙනෙකුගෙන් සමන්විත විනිසුරු මඩුල්ලක් විසින් විභාග කරන ලද අතර, ඉතාමත් ජ්‍යෙෂ්ඨ විනිසුරු වූ ශිරාණි බණ්ඩාරනායක, එකී විභාගයේදී මහත් උනන්දුවකින් යුතුව බලපෑමට තැත් කරන ආකාරයේ භූමිකාවක් රඟ දක්වන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කලින් පී.බී. ජයසුන්දරට එරෙහිව රජයේ නිල තනතුරු දැරීම තහනම් කළ නියෝගය සහ ඔහු ඒ අනුව රජයේ නිල තනතුරු දරන්නේ නැති බවට ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කළ දිවුරුම් ප්‍රකාශයද පිලිවෙලින් අවලංගු කිරීමේ පදනම මත, 2009 සැප්තැම්බර් 24 කාර්ය දිනැති සටහනේ වාර්තා වි ඇති පරිදි, පිලිවෙලින් ප්‍රධානතම (a) සහ (b) ආයාචනයන් අඩංගු පෙත්සමේ එම ආයාචනයන් ශ්‍රේෂ්ඨාධිකරණයේ 7 පුද්ගල විනිසුරු මඩුල්ල අවසර ලබා නොදී ප්‍රතික්ෂේප කරන ලදී. ඉංග්‍රීසි භාෂාවට නව අර්ථකතනයක් දෙමින්, කෙසේ නමුදු අනියම් (c) ආයාචනයේ ඇයද ඇති **"වෙනත් එවැනි සහ වැඩිපුර සහනයන්..."** මත එම ඉල්ලා සිටි ආයාචනයන්ට ඉඩදිය යුතු බව ශිරානි බණ්ඩාරනායක විනිසුරුවරිය විසින් සෘජු ස්ථාවරයක් ගන්නා ලද්දේ, ශිරානි තිලකවර්ධන විනිසුරුතුමියගේ එකම විසම්මතික තින්දුවත් සමගය. කෙසේ නමුත් ප්‍රධානම සහනයන්ට අතිරේකයක් හා අනුපුරුකක් ලෙස පැවති අනියම් වුන (c) ආයාචනයෙහි පතා සිටි **"වෙනත් එවැනි සහ වැඩිපුර සහනයන්..."** ප්‍රධානතම සහනයන් ප්‍රතික්ෂේප කර සිටි අවස්ථාවක, එම ප්‍රධාන සහනයන්ම එලෙස වක්‍රව ප්‍රදානය කිරීම උග්‍ර ප්‍රශ්නයකට තුඩු දෙන්නක් නොවේද ?.(*Google Books – ['IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 3: Colombo Port Bunkering Privatisation – Annulled as Illegal & Fraudulent by Supreme Court'](#)*)

ආනුශංගිකව පී.බී. ජයසුන්දර විසින්ම මෙහෙයවා තිබුණ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පෞද්ගලීකරණය අංක SC(FR) 158/2007 හි නීති විරෝධී හා අනෛතික පෞද්ගලීකරණයක් වශයෙන් 2009 ජුනි 4 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අහෝසි කරනු ලැබ, එය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් රජයේ සන්තකයට පවරන ලදුව, එහි අධ්‍යක්ෂ මණ්ඩලයට වෘත්තිකයින් පත් කරන ලෙසට නියෝග කරන ලදී. ඉන් අනතුරුව අලෙවි කිරීම පිළිබද ඩිප්ලෝමාවක් උසුලනු ලබතැයි කියන ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියගේ ස්වාමිපුරුෂයා වන ප්‍රදීප් කාරියවසම්, වෙනත් අයවලුන් අතර, අධ්‍යක්ෂකවරයකු ලෙස පත් කිරීමට එන්. ජී. අමරතුංග විනිසුරුතුමා මුලසුන හෙබවු කේ. ශ්‍රීපවන් සහ පී. ඒ. රත්නායක විනිසුරුවරුන්ද සහිත වුන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලක් විසින් 2009 ජුනි 26 දින අනුමත කරන ලදී. (*Amazon Books – ['IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 4: Sri Lanka Insurance Privatisation - Annulled as Unlawful & Illegal by Supreme Court'](#)*)

ඉන් අනතුරුව, භාණ්ඩාගාර ලේකම් වශයෙන් ඉහත ප්‍රකාර රජයේ නිල තනතුරු දැරීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසර ලබා ගැනීමට 2009 ජූලි මසදී පී.බී. ජයසුන්දරගේ 2009 ජූලි 7 දිනැති පෙත්සමට සමසිද්ධිමය වශයෙන්, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියගේ ස්වාමි පුරුෂයා සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපති ලෙසද, ලංකා හොස්පිටල්ස් PLC සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්ද, උසස් තත්වයේ දේශපාලනමය නිල තනතුරු දැරීම භාරගත් අතර, පසුව 2010 මැයි මසදී රාජ්‍ය බැංකුවක් වන ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපති ලෙසද නිල තනතුරු ඔහු විසින් හොබවන ලදී. මෙම අවස්ථාගත තත්වයන්හිලා, 2009 සැප්තැම්බර් 24 දින පී.බී. ජයසුන්දරගේ ඉහත කී පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇසීමෙන්ද, භාණ්ඩාගාර ලේකම් වශයෙන් රජයේ කාර්යාලයට නැවතත් පත්කිරීමට තීරණයක් ගැනිමෙන්ද, 2011 ඔක්තෝබර් 24 දිනැති ඉහත කී ව්‍යවස්ථාවට පටහැනි විශේෂ තීරණය ප්‍රගහණය වන්නාවු අධිකරණමය පක්ෂපාතිත්වය මත, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය පැහැදිලි ලෙසම නුසුදුසු තත්වයක සිටින ලදී. එපමනක්ද නොව, රජයට එරෙහිව පමුනුවනු ලබන යම් වෙනත් අයැදුමක් ඇසීමටද එම නුසුදුසුතාවය බලපානු ලැබේ. - සාමිවරුන්ගේ මන්ත්‍රණ සභාවේ (House of Lords) විලියානු ජනපති පිනොචේ පිළිබඳ නඩුවේ තීන්දුව බලන්න.(*Amazon Books – 'IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 4: Sri Lanka Insurance Privatisation - Annulled as Unlawful & Illegal by Supreme Court'*)

සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපති එවකට ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු ශිරානි බණ්ඩාරනායකගේ ස්වාමිපුරුෂයා වු ප්‍රදීප් කාරියවසම් මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා යටතේ නිල රාජකාරිවල යෙදෙන්නකු විමෙන්, පී.බී. ජයසුන්දරගේ පෙත්සම විභාග කර නියෝග දීමට ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය සෘජුවම නුසුදුසු පුද්ගලයෙකු විය. මා විසින් උපුටා දක්වන ලද සාමිවරුන්ගේ මන්ත්‍රණ සභාවේ (House of Lords) විලියානු ජනපතිගේ නඩුවේ අධිකරණමය පක්ෂපාතිත්වයේ චෝදනාවට වඩා ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියගේ ඉහත කී ක්‍රියා පටිපාටිය අතිශයින්ම *'සාපරාධී වරදක්'* වන බව මම 2012 ජනවාරි 9 වන දින මාගේ අංක SC(FR) 534/2011 නඩුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ලිඛිතව සැලකර සිටියෙමි.

මාගේ එවැනි වැඩිදුර ලිඛිත ඉදිරිපත් කිරීම්හි ඉහත කී 7 දෙනාගෙන් සමන්විත ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලේ සාමාජිකාවක් වූ ශිරානි තිලකවර්ධන විනිසුරුතුමියගේ **විසම්මතික** තින්දුවේ පහත දැක්වෙන ඡේද ප්‍රෝක්තය උපුටා දැක්වුයෙමි.(*Amazon Books- 'IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 3: Colombo Port Bunkering Privatisation – Annulled as Illegal & Fraudulent by Supreme Court'*)

> "ඔහු විසින් දෙවරක් එනම් 2009 ජූලි 21 සහ 2009 ජූලි 31 දිනයන්හි දෙවරක්ම සංශෝධනය කරනු ලැබුවා වූ 8 වන වගඋත්තරකාර පී.බී. ජයසුන්දර විසින්, 2009 ජූලි 7 දින ගොනු කළ පෙත්සමට අනුගාමිව, මෙම පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු 7 දෙනෙකුගෙන් යුත් මඩුල්ලක් අභියස ලැයිස්තුගත කරන ලදී.... .
>
> 2009 ජූලි 31 දිනැති සංශෝධිත පෙත්සමෙහි ආයාචනයන්හි (a) සහ (b) ඡේදයන්හි ඇයද සිටි සහනයන් ලබා දීම අධිකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙසේ වුවද, සංශෝධිත පෙත්සමෙහි ආයාචනයන්හි (c) ඡේදය යටතේ වන අනිකුත් සහනයන් ප්‍රදානය කිරීමට අධිකරණය යොමු වේ.
>
> පෙත්සම්කරු (පී.බී. ජයසුන්දර) 2009 ජූලි 21 දින ඔහුගේ පෙත්සම සංශෝධනය කළේ, එසේ කිරීමට අධිකරණයේ අවසරයක් නොගෙනය. සංශෝධනය සම්බන්ධයෙන් තහවුරු කිරීමේ දිවුරුම් ප්‍රකාශය වඩාත් විශේෂයෙන්ම සාම විනිසුරුවරයෙකුගේ / දිවුරුම් කොමසාරිස්වරයෙකුගේ අත්සනකින් තොරව සිදු කර ඇත. මේ නිසා එම දිවුරුම් ප්‍රකාශය සහතිකයක් නොමැති, අවලංගු සහ අසත්‍ය බවට පත් කෙරේ. ඒ අනුව 2009 ජූලි 21 දිනැති සංශෝධිත පෙත්සම වලංගු දිවුරුම් ප්‍රකාශයකින් තහවුරු කිරීමකින්

**තොරව වු නිසා, එම දිවුරුම් ප්‍රකාශය මුල් අවස්ථාවේදීම ප්‍රතික්ෂේප කළ යුතුව තිබුනි.**

**ඉන් පසුව 2009 අගෝස්තු මස 3 දින මෙම නඩුව ඇසීමේදි, 2009 ජුලි 31 දිනැති තවත් දෙවැනි සංශෝධිත පෙත්සමක් සහ 2009 ජුලි 31 දිනැති අභිප්‍රේත දිවුරුම් ප්‍රකාශයක් අඩංගු නව ලේඛණ කට්ටලයක් ගොනු කරන ලද්දේ නැවත වරක් අධිකරණයේ අවසරයක් නොමැතිවය"**

**එසේ වුවද, ශිරානි බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරිය යථෝක්ත කාරණයන් පිළිබඳව උපහාසාත්මකව දෙබිඩි පිළිවෙතකින් යුතුව, අනුමතකර සිටියේ වී නමුත්, මහජන සුභසිද්ධිය සඳහා වුන, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අභිප්‍රේත තෙල් හෙජින් ගනු දෙනු පිළිබඳ, මාගේ අංක** SC(FR) **481/2009 නඩුවේදී, ඇය ඊට ප්‍රතිවිරුද්ධ ලෙසින් 2009 නොවැම්බර් 19 දින, මාගේ පෙත්සම සංශෝධනය කිරීමට මෝසමක් මගින් තහවුරු කර සිටින ලෙසටත්, ශ්‍රේෂ්ඨාධිකරණ රීති ප්‍රකාර ශ්‍රේෂ්ඨාධිකරණයේ පූර්ව අනුමැතිය ලබා ගන්නා ලෙසත්, නියෝග කරමින් මාගේ පෙත්සම සංශෝධනය කිරීමේ කාරණය තහවුරු කිරීම 2010 පෙබරවාරි 11 දිනට සිදු කිරීමට නියම කරන ලදී.**(*Google Books – 'Derivative / Hedging Deals by Citibank, Standard Chartered Bank, Deutsche Bank, with Sri Lanka Government's Petroleum Corporation - Dubious & Illegal ?'*)

**ඊට අමතරව අභියාචනයකදී හෝ ඉල්ලීමකදී, *ලිඛිත දේශන කලින් ගොනු කිරීමකින් තොරව*, කිසිදු පාර්ශවයකට සවන් යොමු කරවා ගැනීමේ හිමිකමක් සතු නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණ රීතීන්හි 30(1) රීතිය නියමාකාර ලෙස දක්වනු ලැබ ඇත.(*අවධාරණය එකතුකරා*)**

''ශ්‍රේෂ්ඨාධිකරණ රීති 1990
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 665/32 ගැසට් පත්‍රයේ
1991, ජුනි 07 දින (අතිවිශේෂ)
11 කොටස
අභියාචනා සහ ඉල්ලුම්පත් පිළිබඳ සාමාන්‍ය ප්‍රතිපාදන

30 (1) ඔහු විසින් කලින් ඔහුගේ ලිඛිත ඉදිරිපත්කිරීම්වල පිටපත් පහක් (මින්මතු 'ඉදිරිපත් කිරීම්' යනුවෙන් හැඳින්වේ) මෙම රීතියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව ක්‍රියා කරමින් තැන්පත් කර නොමැත්තේ නම්, ඇපෑලක මොනයම් හෝ පාර්ශවයක් සවන් යොමුකර ගනු ලැබීමට හිමිකම නොලබයි.''

**පී. බී. ජයසුන්දරගේ ඉහත කී අයැදුමක් වූ** SC(FR) **209/2007 සම්බන්ධයෙන් 2009 සැප්තැම්බර් 24 දින පුද්ගලිකව ලිඛිත ඉදිරිපත්කිරීම් කර තිබුන එකම පාර්ශවය මා වුන නමුදු, මෙම කාරණය පිළිබඳවම පමණක් මුළු දවස පුරාම අසුන් ගත් 7 පුද්ගල විනිසුරු මඩුල්ල අභියස නැවත නැවත ඉදිරිපත් කිරීම් සිදු කිරීමට පී.බී. ජයසුන්දරගේ ජ්‍යෙෂ්ඨ නීතීඥවරයාට අසීමිත කාල සීමාවක් ප්‍රදානය කළ අතර, මුල් පෙත්සම්කරුගේ ජ්‍යෙෂ්ඨ නීතීඥවරයාටද සෑහෙන කාලයක් ඉඩ සලසා දෙන ලදී. එහෙත් ඉහත ශ්‍රේෂ්ඨාධිකරණ නීති අනුව ඉදිරිපත් කිරීම සිදු කිරීමට හිමිකම් තිබූ එකම පාර්ශවය වුන මා හට උපහාසාත්මකව ඉඩ දෙන ලද්දේ, මුලසුන දැරූ ගරු අගවිනිසුරු අශෝකද සිල්වා ඉදිරියේ විනාඩි 10 කට සීමා වුන ඉතාමත්ම සුළු කාල සීමාවක් වන අතර, එයද ඩී. ජේ. ද එස්. බාලපටබැඳි ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු විසින් මාගේ ඉදිරිපත් කිරීම් වලින් මා වලක්වාලීමට පවා නිෂ්ඵලදායී ලෙස උත්සාහ දරද්දීය.**(*Google Books - 'IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 3: Colombo Port Bunkering Privatisation – Annulled as Illegal & Fraudulent by Supreme Court'*)

**උපහාසාත්මක කරුණ නම්, අගවිනිසුරු අශෝක ද සිල්වා ශ්‍රේෂ්ඨාධිකරණයේදී ඔහුව පිළිගැනීමට උත්සවාකාරයෙන් පැවති රැස්වීමේදී ඔහුගේ කතාව අතරතුර කරනු ලැබූ ප්‍රකාශය, එනම් ඔහු විසින් පවසද ලද – ''ධම්ම පදයේ එක් පදයක් වෙත ඔබගේ කාරුණික අවධානය යොමු කරමි – 'පුද්ගලයකු කඩිමුඩියේ නිසි අවධානයකින් තොරව නඩු බේරුම්කරණය කළ පමණින් ඔහු සාධාරණ විනිසුරුවරයකු නොවේ. ප්‍රඥාවන්ත විනිසුරු**

**හොඳින් විමර්ශනය කර බලා, පක්ෂපාතී විමකින් තොරව ඔහුගේ තීන්දුව ලබා දේ.' " (2009 ජුනි 22, ඩේලි නිවුස්) යන්නයි. මුතුර්හි නව අධිකරණය විවෘත කරන සමාරම්භක උත්සවයට සහභාගි වෙමින් අගවිනිසුරු අශෝක ද සිල්වා පවසා සිටියේ, නීතිය හා නීතියේ පරිපාලනය පවත්වා ගෙන යාමේ වගකිවයුතු සහ උදාර වෘත්තියකට අයත් සාමාජිකයන් වශයෙන් අප කිසිම ආකාරයක දූෂණයක්, අගතිගාමී ඥාති සංග්‍රහයක් නොඉවසිය යුතුය යන්නයි. (2010 ජුලි 10, ඩේලි නිවුස්)**

**ඇත්ත වශයෙන්ම** SC(FR) **209/2007 මුල් අයැදුම්පත අසන ලද අවස්ථාවේදී, මම වගඋත්තරකරුවකු වශයෙන් පුද්ගලිකව පෙනී සිට විස්තරාත්මක සහ අංග සම්පූර්ණ වාචික හා ලිඛිත ඉදිරිපත් කිරීම් සිදු කරන ලද අතර, එම නඩුවෙහි ප්‍රශ්නගත කරුණ වූ අදමය පෞද්ගලීකරණය සාර්ථක ලෙස 2008 ජුලි මස 21 දින ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ශූන්‍ය කරවා ගැනීමට හැකිවූ අතර, එහි නඩු තීන්දුවෙන් පී. බී. ජයසුන්දරට බරපතල ලෙස දොස් පවරා, ඊට අනුශාංගිකව ඔහුට රජයේ තනතුරින් වලින් ඉවත් වීමට බල කෙරුණි.**(*Google Books - 'IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 3: Colombo Port Bunkering Privatisation – Annulled as Illegal & Fraudulent by Supreme Court'*)

**ජේ. ඒ. එන්. ද සිල්වා ශ්‍රේෂ්ඨාධිකරණ අගවිනිසුරුවරයාගේ දියණිය හා එවකට විවාහව සිටි ඩී. ජේ. ද එස්. බාලපටබැඳි ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයාගේ පුත්‍රයා ද, හේග්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දෙවැනි ලේකම්වරයා වශයෙන් දේශපාලනමය පත්වීමක් පිළිගෙන තිබුන අතර, එමගින් පී.බී. ජයසුන්දරගේ ඉහත කී පෙත්සම 2009 සැප්තැම්බර් මස 24 දින ඇසීමට හෝ නියෝග දීමට, මෙම ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් දෙදෙනාට ප්‍රගහණය වන්නාවූ අධිකරණමය පක්ෂපාතිත්වය මත, වලක්වා ලනු ලැබ නොසිටියෙහිද ? චිලියානු ජනාධිපති පිනෝචේ පිළිබඳව වුන සාමිවරුන්ගේ මන්ත්‍රණ සභාවේ** (House of Lords) **නඩු තීන්දුව බලන්න. ශිරානි බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණ අගවිනිසුරුවරිය දෝෂාභියෝගයට ලක් කිරීමෙන් අනතුරුව, උපහාසාත්මක ලෙස ඇය විසින්ම එවකට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත මාධ්‍යයට නිකුත් කළ ලිපියක් මගින්, ජේ. ඒ. එන්. ද සිල්වා අගවිනිසුරුවරයාගේ හා ඩී. ජේ. ද එස්. බාලපටබැඳි විනිසුරුවරයාගේ පක්ෂපාති ක්‍රියා චරියාව සහ කරුණු ගැන විදහා දක්වමින් චෝදනා කොට ඇත.**

**2009 ඔක්තෝබර් 13 දින දුන් ශ්‍රේෂ්ඨාධිකරණයේ 7 පුද්ගල විනිසුරු මඩුල්ලකින් යුත් විනිසුරුවරුන් 6 දෙනෙකුගේ නඩු තින්දු 5 කින් (එකක් එක්ව) 2009 සැත්තැම්බර් 24 දින දෙන ලද තිරණය අනුව නින්දා සහගත ප්‍රතිඵලයකට තුඩු දුන් මෙම ජවනිකාව පැහැදිලි කළ නොහැකි තරමේ වැඩිදුර මානයකට රැගෙන ගොස් තිබුණේ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරියක වූ ශිරානි තිලකවර්ධනගේ අසම්මුතික නඩු තින්දුව හිතා මතාම උපක්‍රමශීලී ක්‍රියාවක් මගින් පැහැදිලි ලෙසටම එළිදරව් කරමින්, එහි මුද්‍රිත අකුරු විශාල අකුරු ශෛලයකට වෙනස් කරමින්, වැදගත් ලෙසින්ම උචිත වුණාවූ පිටු දෙකක් අත හැරීමට, පිටුවලට නව අංක යොදමින්, එම පිටුවට පෙර පිටුව වුණ ප්‍රභන්දය කරන ලද්දාවූ පිටුව සම්පූර්ණ වුන ජේදයකින් අවසාන වුන අතර, එහි අවසන් පිටුව ලෙසට අසම්පූර්ණ ජේදයකින් ආරම්භ වුන, ශිරානි තිලකවර්ධන විනිසුරුවරියගේ අත්සන ඇතුලත් පිටුව අවසන් පිටුව ලෙස එකතු කරමින්, ශිරානි තිලකවර්ධන විනිසුරුවරියගේ අසම්මුතික නඩු තින්දුව ශ්‍රේෂ්ඨාධිකරණයේදීම කඩා කප්පල් කරන ලදී. එම නඩු තීන්දුවේ අනුවාද දෙකෙහිම සහතික පිටපත් ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ටාර් වරයාගෙන් ලබා ගනු ලැබ, එම එළිදරව්ව පිළිබඳව මම පැමිණිලි කර සිටියේ වි නමුත්, ඒ පිළිබඳව කිසිදු පරීක්ෂණයක් නොපැවැත්වුනි.** (*Colombo Telegraph - *Full Text: Letter By Chief Justice Shirani Bandaranayake To DG Bribery Commission*

**ශිරාණී තිලකවර්ධන විනිසුරුවරියගේ විසම්මතික නඩු තීන්දුවේ සම්පූර්ණ පිටු දෙකක් යටපත්කර අතහැර තිබුණේ, කුට ලෙස අකුරු වර්ගය සහ වදන් වල ප්‍රමාණය පරිගණකයෙන් විශාල කිරීමෙන් බව මට අවබෝධ විය. මෙය කර ඇත්තේ අකුරු විශාල ප්‍රමාණයකට වෙනස් කර එනම් පළමුවන පිටු 15 හි 'සෙන්චරි ගොතික් ෆොන්ට්' ප්‍රමාණය විශාල කර, එමගින් පිටු 17 වන සේ විශාල කොට, එම විශාල කළ පිටු 16 සහ 17 ඉවත් කරීමෙන් එහි අඩංගු ජනාධිපතිවරයාගේ ව්‍යවස්ථා වගකීම් යටපත් කිරීමෙනි.**

**ඉන්පසුව එම විශාල අකුරු සහිත එනම් 'සෙන්චරි ගොතික් ෆොන්ට්' අකුරු සහිත පලමුවන පිටු 14 ක් පත්‍රිකා 7 ක දෙපැත්තේ ඡායා පිටපත් කර, 8 වන පත්‍රිකාවේ ඉදිරිපස එම විශාල අකුරු එනම් 'සෙන්චරි ගොතික් ෆොන්ට්' සහිත 15 වන පිටුවේ ඡායා පිටපතක් අන්තර්ගත කර ඇති අතර, 8 වැනි පිටුවෙහි පිටුපස පැත්තේ ශිරාණී තිලකවර්ධන විනිසුරුවරියගේ විසම්මතික නඩු තීන්දුවේ කුඩා 'කැලිබ්‍රි අකුරු' සහිත ශිරාණී තිලකවර්ධන විනිසුරුතුමියගේ අත්සන ඇතුලත් අන්තිම 16 පිටුව වන පරිදි පහත දැක්වෙන සේ ඡායා පිටපත් කර ඇත.**(*Google Books – ['IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 3: Colombo Port Bunkering Privatisation – Annulled as Illegal & Fraudulent by Supreme Court']*)


Finally can the Court on its own volition free him from this undertaking merely because the President has expressed a concern to have him back? In considering this I am mindful of the fact that despite affidavits being tendered to Court, apologies being made to Court and the findings of the judgment, the Petitioner has *falsely made contrary representations* to the Secretary to the President in letters (marked "A") dated 25th July 2008 and (marked "F") dated 3rd June 2009. In his letters to the Secretary he contradicts the contents of his own affidavit, the submissions of his own counsel made at the time in Court and which is recorded in contemporaneous proceedings, and, in that sense, appears to be uncertain and confused. Did the Petitioner, in his affidavit, mean what he said or has he fabricated his stance? To say the least his word, in its varied contradictions, appears fickle.

13 OCT 2009

15

leads to a halt in the growth of the other. The promptings of a kind compassionate heart or sympathetic urgings must necessarily be bridled in dealing with the resources of the State, for it ultimately belongs to the People and must be in the custodianship of honest, disciplined, hardworking and effective public officers.

I accordingly dismiss the amended petition. No Costs.

JUDGE OF THE SUPREME COURT

13 OCT 2009

SRI LANKA

16

**මෙවැනි කුට උපක්‍රමයක් මගින්, ශිරාණී තිලකවර්ධන විනිසුරුතුමියගේ එකම විසම්මතික නඩු තීන්දුවේ වැදගත්ම පිටු දෙකක් යටපත් කර, ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යලය විසින් 2009 ඔක්තෝබර් 13 දින එම ව්‍යාජ පිටපත මාධ්‍යයට නිකුත් කිරීමෙන්, එය මත 2009 ඔක්තෝබර් 14 දින මාධ්‍ය වර්තාවල අනෙකුත් නඩු තීන්දු වලට පුළුල් ප්‍රචාරයක් ලබාදී තිබු අතර, ඉහත කී වැදගත් යටපත් කර තිබු පිටු දෙකේ සදහන්, මහජන සුභ සිද්ධිය සඳහා මාධ්‍යයෙහි වර්තා කළ යුතුව තිබූ, ජනාධිපති විසින් විධායක බලය පාවිච්චි කිරීම පිළිබඳ ව්‍යවස්ථාවේ සීමාවන් ඇති බවට වැදගත් සහ අදාල අන්තර්ගතයන් ගැන වාර්තා කිරීම වලක්වා තිබුනි. එසේ කරන ලද්දේ, කුට උපක්‍රමශීලී ලෙස එම වැදගත් සහ අදාල නිගමනයන් අඩංගු එම විසම්මතික නඩු තීන්දුව මාධ්‍යයේ පලකිරීම වළක්වා යටපත් කීමටය.**(*Amazon Books – ['IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 3: Colombo Port Bunkering Privatisation – Annulled as Illegal & Fraudulent by Supreme Court']*)

**ඉරණම පරිදි අහඹු ලෙස දැනුවත් වූ දෙයක් වන, නුවර පදිංචි මාගේ සමීප ඥාතියකුගෙන් දැන ගැනීමට ලැබුණු පරිදි, මෙම නඩු තීන්දුව ලබා දුන් දිනට පෙර දින එනම් 2009 ඔක්තෝබර් 13 අගහරුවාදා දින මෙම ඥාතියා කොළඹට ඒමට මෙම අධිකරණ නිවසේ නවාතැන් ගෙන සිටි අතරතුර, 2009 ඔක්තෝබර් 12 සඳුදා දින රාත්‍රී 7.00 ට පමණ විනිසුරුවරුන් 7 දෙනෙකුගෙන් යුත් විනිසුරු මඩුල්ලේ සිටි එක් විනිසුරුවරයකු, අගවිනිසුරු අශෝක ද සිල්වා විසින් හදිසි නිශාචර රැස්වීමකට කැදවා ඇති අතර, එම නිසා අනුමාන ලෙස ඔහු එයින් පසුව ඉහත නඩුවට අදාළ ලිපි ගොනු රැගෙන නොපමාව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගොස්, විසම්මුතික විනිශ්චයාකාර විසම්මුතික නඩු තීන්දුව දැනුම් දී තිබේ.**

**'මහජනයාට යුක්තිය හා සාධාරණත්වය අවශ්‍යයි' යන ශීර්ෂ පාඨය යටතේ සදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡාවක් අතරතුරදී, අගවිනිසුරු අශෝක ද සිල්වා විසින් ප්‍රකාශ කරන ලද්දේ – ''මෙම අධිකරණය දැඩි අපක්ෂපාතී සහ සීමාවට ඉහළින් විය යුතුය. මාගේ සේවා කාලය තුල 'ඕපාදුප' සහ 'දුරකතන' යුක්තිය සදහා ඉඩක් නොමැති වනු ඇත. මම සෘජුව හෝ වක්‍රව අධිකරණයේ කිසිදු සාමාජිකයකුට බලපෑමක් සිදු කිරීමට ඉඩ ලබා නොදෙන අතර, ඔවුන් දැඩි ලෙස දේශපාලන හෝ වෙනත් කිසිදු අනිසි බලපෑම් හෝ දිරිගැන්වීම් වලින් සුරක්ෂිත කරනු ඇත. මහජනතාවගේ ගෞරවය සහ විශ්වාසය ඇතිවන පරිදි, විනිශ්චයකරුවන් මහජනතාව ඉදරියේ 'මනා චරිතයකින්' සිටිය යුතුය'' යනුවෙනි. – (2009 ජූලි 19, සන්ඩේ ඔබ්සර්වර්)**

ශ්‍රේෂ්ඨාධිකරණය අභියස **2012** පෙබරවාරි **9** වන දින මාගේ අංක **534/2011** දරණ මූලික අයිතිවාසිකම් පෙත්සමෙන්, ඉහත "හදිසි පනත් කෙටුම්පතක්" සම්බන්ධව විශේෂ තීන්දුව **2011** ඔක්තොබර් **24** දින ලැබීමෙන්, මා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට කරන ලද ඉහත සඳහන් එළිදරව් කිරීම මා විසින් සිදු කරනු ලැබුයේ මහජන සුභසිද්ධිය සඳහා වුන නමුත්, තිගැස්සීමට හා ත්‍රාසයට පත්වුන *Amicus Curiae* (අධිකරණයට නිතිමය තත්වයක් හා කාරණා පිළිබඳව සහයක-අධිකරණ සහායක) වශයෙන් ගරු නීතිපති ජනාධිපති නීතිඥ මොහාන් පීරිස් වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිසිටර් ජනරාල්වරයා සහ වගඋත්තරකරු ආර්ථික සංවර්ධන අමාත්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී, බැසිල් රාජපක්ෂ වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නිතිඥ ඩී. එස්. විජේසිංහ, මහජන කැලඹිල්ලක් හා ආන්දෝලනයක් එමගින් හට ගැනීමේ බියක් පළ කරමින්, මාගේ එම වැඩිදුර ලිඛිත ඉදිරිපත් කිරීම් වලට තරයේම විරෝධතාවය දක්වා, එය යටපත් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් බැගෑපත්ව ඉල්ලා සිටියේය. ඔ ම නිසා මහජනයා අභියස එම අගතිදායි කරුණු එළිදරව් වීම වසන් කරමින්, මා විසින් ඉදිරිපත් කළ ලිඛිත ඉදිරිපත් කිරීම් නඩු වාර්තාවෙන් ඉවත් කොට, මා හට ආපසු දෙන ලෙසට මුලසුනගත එන්. පී. අමරතුංග විනිසුරුතුමා විසින් උපදෙස් ලබා දීමට හේතු විය. – (*Google Books – 'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'*)

එසේ නමුත් **2012** පෙබරවාරි **9** වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේ නීති කෘතීන් විස්තීරණ ලෙසින් වාර්තා කරමින්, මාගේ ඉහත සඳහන් ලිඛිත ඉදිරිපත් කිරීම් හා වැඩිදුර ලිඛිත ඉදිරිපත් කිරීම් අඩංගු කරමින්, ඉහත කී පරිදි මාගේ ඉල්ලීම ඉදිරියට ගෙන යාම සඳහා අවසරය මට අහිමි කරන ලද අතර, එය සමාලෝචනය කොට නැවත සලකා බලන ලෙසට ඇයැදමින්, මම **2012** මැයි **8** වන දින ශ්‍රේෂ්ඨාධිකරණයට තවත් පෙත්සමක් ඉදිරිපත් කළෙමි. එම පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එන්. පී. අමරතුංග විසින්ම ඔහුගේ නිල කුටියේදීම ප්‍රතික්ෂේප කළේ, මට සවන්දීමට අවස්ථාවක් නොදෙමින්ය. එනමුත් මාගේ පෙත්සමේ වාර්තා කොට තිබුනු **2012** පෙබරවාරි **9** දින මෙම නඩුව ඉදිරියට ගෙන යාම වැලැක්වුයේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එන්. පී. අමරතුංග විවෘත අධිකරණයේ ඉහත කී ලෙස දැනුම් දුන් පරිදි, **'ශ්‍රේෂ්ඨාධිකරණ අගවිනිසුරුවරිය ශිරානි බණ්ඩාරනායක විසින් විධානය කර තිබුනේ, එම නොතීසි නිකුත් කර තිබු ශ්‍රේෂ්ඨාධිකරණ ත්‍රි පුද්ගල විනිසුරු මඩුල්ලම මට සවන් දීමට පමණක් බවත්, නඩුව ඉදිරියට ගෙන යාමට අවසරය නොදෙන ලෙසය'**.ඉහත කී ප්‍රකාර මෙම කාරණය මා විසින් ලේඛණ ගතකර තිබියදී, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එන්. පී. අමරතුංග විසින් **2012** මැයි **8** වන දින මාගේ පෙත්සම ඇසීමට ඉඩ ලබා නොදුන් අතර, මා විසින් වාර්තාගත කරනු ලැබූ කරුණු ප්‍රතික්ෂේපද නොකළේය.(*Google Books – 'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'*)

ඉන් අනතුරුව, පාර්ලිමේන්තුවේ සියළුම දේශපාලන පක්ෂවල නායකයන්ගේ එකගතාවය මත, ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ තීරණයන්ට අදාලව, **2012** ඔක්තෝබර් **9** වන දින ප්‍රකාශයට පත්කළ පාර්ලිමේන්තු රීති මගින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අභිප්‍රාය පරිදි, පුරවැසියකු සතුව පවතින අයිතියක් බලාත්මක කිරීමට, වැරදි සහගත විශේෂ තීරණ නැවත සැලකිල්ලට යොමු කොට, සද්භාවයෙන් යුතුව වුන දෝෂ නිවැරදි කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට උනන්දුවකින් යුතුව කටයුතු කළ හැකි බව, වෙනත් දේ අතර, ප්‍රකාශ කර සිටින ලදී. ගරු කථානායකවරයා විසින් ප්‍රකාශයට පමුණුවනු ලැබුන එම රීතියෙහි සම්බන්ධතාවයෙහිලා **2012** පෙබරවාරි **9** වන දින ශ්‍රේෂ්ඨාධිකරණ නීති කෘතින්ද ඇතුළත් කොට, සියලුම ලේඛණ අමුණමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **123 (3)** ව්‍යවස්ථාව විධානාත්මක කර ඇති පරිදි **2011** ඔක්තෝබර් **24** දිනැති විශේෂ තීරණය, එම විශේෂ තීරණය දුන් විනිසුරු මඩුල්ල විසින් නැවත සැලකිල්ලට යොමු කොට සමාලෝචනය කර, එය නිවැරදි කරන ලෙසට අයැදමින් මා විසින් ක්ෂණිකව අංක SC(SD) **2/2011** හි වැඩිදුර පෙත්සමක් **2012** ඔක්තෝබර් **18** දින ඉදිරිපත් කළෙමි.(*Google Books – 'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'*)

2012 ජනවාරි 18 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වුන සමාලෝචනය සඳහා මෙම වතාවේදී මාගේ ඉල්ලීම ව්‍යවස්ථානුකූලව සෘජුවම ශිරානි බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණ අගවිනිසුරුවරිය වෙත යවා තිබුණේ වී නමුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123 (3) ව්‍යවස්ථාව සමග කියවෙන 132 ව්‍යවස්ථාවේ නියමයන් අනුව, මාගේ පෙත්සම ශිරානි බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණ අගවිනිසුරුවරිය වෙත සෘජුවම යොමු කිරීම නඩු ලැයිස්තුගත කිරීම භාරව සිටි කේ. ශ්‍රීපවන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයා විසින් කුතුහලය දනවන අයුරින් වළක්වන ලදී.(*Google Books – ['Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law']*)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රකාර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථකතනයක් කළ යුතු වන්නේ, එය වැදගත් කාරණයක් වන බැවින් පූර්වාදර්ශයක් වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු මඩුල්ලක් විසින් වන නමුත්, මා හට සවන් දීමකින් තොරව සහ කථානායකතුමාගේ ඉහත කී ප්‍රකාශ කළ රීති නොතකමින්, තනිවම සිය නිල කුටියේදි මාගේ පරීක්ෂා කිරීමේ අයැදුම් පෙත්සම මත විනිශ්චයක් කිරීම, කේ. ශ්‍රීපවන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයා විසින්ම ඔහු වෙතට පවරා ගනිමින්, "මෙම 80(3) ව්‍යවස්ථාවේ අර්ථකතනය කළ යුත්තේ එහි යථාර්ත අරමුණ සහ අභිලාශය අනුව" ය යනුවෙන් යයි, මාගෙන් තර්ක නොවිමසා, එකපාර්ශ්වික ලෙස තීරණය කර ලේඛණගත කරන ලදී!

"පාර්ශවයක් විසින් විනිසුරු මඩුල්ලේ සමාජිකයකුගේ අධිකරණමය පක්ෂපාතිත්වයක් හෝ නුසුදුසු කමක් සංජානනය කරන්නේ නම්, පනත් කෙටුම්පත පිළිබදව විභාග කිරීමේ අවස්ථාවේදී විරෝධතා නගා සිටිය යුතුව තිබුණි" යනුවෙන් කේ. ශ්‍රීපවන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයා විසින් වැඩිදුරටත් ලේඛණගත කරන තිබුනි. 2011 ඔක්තෝබර් 24 දින විශේෂ තීරණය සිදු කිරීමේදී, අනාවරණය වු රහසිගතභාවය හා කඩිමුඩිය කරන කොට ගෙන, ජනතාවට කිසිදු දැනුම් දීමක් නොකොට, එම "හදිසි පනත් කෙටුම්පත" බලපාන පාර්ශවයන්ටත් නොතීසි නිකුත් නොකරමින් තිබුනු අවස්ථාවක, කේ. ශ්‍රීපවන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයාගේ එවැනි ලේඛණගත කීරීම විශ්මයට තුඩු දෙන්නක් විය. මාගේ පෙත්සමෙහි ඉදිරිපත් කර තිබු කරුණු මත, කේ. ශ්‍රීපවන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයා විසින් මාගේ පෙත්සම පිළිබද විනිශ්චයක් කිරීම සම්බන්ධයෙන් මට විරුද්ධ වීමට අවශ්‍යතාවය තිබුන නමුත්, එයට විරෝධතාවයක් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් මට නොලැබුණේ, කේ. ශ්‍රීපවන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයා විසින්ම, ඔහුගේ නිල කුටියේදීම මෙම ඉහත කී ලේඛණගත කිරීම සිදුකල නිසාවෙනි.

ඉහත කී ශිරානි බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණ අගවිනිසුරුවරියගේ අධිකරණමය පක්ෂපාතිත්වයක් හෝ නුසුදුසු කමක් සංජානනය කිරීම පිළිබදව කෙලින්ම ඇය විසින්ම ඒ පිළිබදව තීරණයක් ගත යුතුව තිබුන අතර, එය කේ. ශ්‍රීපවන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයාට නිගමනය කරන්නට අයිතියක් තිබුනත්, ඒ අනුව සැකයක් මතු වුයේ ශිරානි බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණ අගවිනිසුරුවරිය ඉහත කී ප්‍රකාර එන්. ජී. අමරතුංග ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයාට විධානයක් දුන් මාගේ SC(FR) 534/2011 පෙත්සම 2011 නොවැම්බර් 25 දින පිළිගනු ලැබ, වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත් කිරීමෙන් අනතුරුව, එන්. ජී. අමරතුංග ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයාට 'මට සවන් දෙනු විනා නඩුව ඉදිරියට ගෙන යාමට අවසරය නොදෙන ලෙසට' කලින් විධානය කර තිබුණාසේම, කේ. ශ්‍රීපවන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයාටද එලෙසින්ම විධානය කර තිබුනේද යන සැගවුනු ප්‍රශ්නය මතු කරමිනි. කෙසේ වෙතත් ඉහත සදහන් පරිදි ඇයගේ ස්වාමිපුරුෂයාට ඉහළ පෙලේ දේශපාලන රාජ්‍ය කාර්යාල පැවැත්වීම සෘජුවම හෝ අනියම් ලෙසින් අදාළ වු මෙම කාරණය කිසිවකු විසින් පෙන්වා දිය යුතුව තිබුනේ නැත. ඒ ගැන ඇය විසින්ම වටහා ගෙන ශිරානි බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණ අගවිනිසුරුවරිය විසින් මේ නඩු පිළබදව ක්‍රියා කිරීමෙන් වැලකී සිටිය යුතුව තිබුනි. (*GoogleBooks – ['IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 3: Colombo Port Bunkering Privatisation – Annulled as Illegal & Fraudulent by Supreme Court'] / ['Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law']/ ['Politics, Justice & the 'Rule of Law']*)

එකකුදු වුවද, ඊට පසු දිනම, එනම් 2012 ඔක්තොබර් 23 දින, කේ. ශ්‍රීපවන් විනිසුරුවරයාගේ විපරීතකාරි මතයට එකඟතාවය දක්වමින් ශිරානි බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණ අගවිනිසුරුවරිය විසින් සටහනක් කරනු ලැබ ඇත. ඉන් පසුව එන්. ජී.

අමරතුංග ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයා, P.A. රත්නායක ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයා හා C. ඒකනායක ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරිය යන තිදෙනා එම සටහනට එකඟතාවය පළකර තිබුනි. ඒ අනුව ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියගේ සංජානනය වූ අධිකරණය පක්ෂපාතිත්වය හා නුසුදුසුතාවය පිළිබඳව, 2012 පෙබරවාරි 9 දින මුල් අවස්ථාවේදීම, මා ඒකාන්ත ලෙස කළ ප්‍රකාශය ඉතා වෙසෙයින්ම බණ්ඩනය කිරීමකින් හා ආරාවුලකින් තොරව පැවතීමෙන්, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය විසින් ඒ පිළිබඳව පුදුමාකාර ලෙස නිහඬව සිටි අතර, එය ප්‍රතික්ෂේප කර නොමැත. ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියගේ හා ඉහත සඳහන් අනිකුත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ ක්‍රියාවරියාව හා පරිපාටිය 2012 ඔක්තොබර් 9 දින ගරු කථානායකතුමා, පාර්ලිමේන්තුවේ සියලුම දේශපාලන පක්ෂවල නායකයන්ගේ එකගතාවයෙන් යුතුව, ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ තීරණයන්ට අදාලව 2012 ඔක්තොබර් 9 වන දින ප්‍රකාශයට පත් කළ රීති මගින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අභිප්‍රාය පරිදි, පුරවැසියකු සතුව පවතින අයිතියක් බලාත්මක කිරීමට වැරදි සහගත විශේෂ තීරණ නැවත සැලකිල්ලට යොමු කොට, සද්භාවයෙන් යුතුව සිදු වුන දෝෂ නිවැරදි කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට බලවත් උනන්දුවකින් යුතුව කළ හැකි බවට වූ නියමයට කිසිම තැකීමකින් තොරව හා "හදිසි පනත් කෙටුම්පත" සැහැල්ලු ලෙස අපහාසයට ලක් කිරීමට තුඩු දුන් ක්‍රියාවක් විය.(*Amazon Books* – *'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'* / *'Politics, Justice & the 'Rule of Law'*)

මාගේ අයිතීන් මත, නිත්‍යානුකූලව කරන්නට අයිතියක් තිබූ පරිදි, කොළඹ හිල්ටන් හෝටලය අයිති හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා)PLC සමාගම ප්‍රතිව්‍යුහගත කරනු පිණිස HC සිවිල් WP නඩු අංක. 52/2011/CO නඩුවෙහිදී, 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ හා එහි නියමයන් ප්‍රකාර, බස්නාහිර පළාත්බද සිවිල් මහාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුනි. එසේ තිබියදී "හදිසි පනත් කෙටුම්පතක්" මුවාවෙන් එම සමාගම රජයට පැවරීමට යම් උනන්දුවක් දක්වන පාර්ශවයන් විසින්, රහසිගතව ඇතුළත් කිරීමෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉක්මවා ගිය සහ ස්වභාවික යුක්ති ධර්මය අභිමිකළ සහ එක්සත් ජාතින්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව සම්මත ප්‍රකාශයේ 17 ව්‍යවස්ථාව නින්දිත ලෙස උල්ලංඝනය කිරීමක් සිදු වුන 2011 ඔක්තෝබර් 24 දිනැති ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියගේ විශේෂ තීරණය මගින්, හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා)PLC සමාගමෙහි ප්‍රධානතම ප්‍රවර්ධකයන්ගෙන් සහ පරදු භාරකරුවන්ගෙන් කෙනෙකු වශයෙන්, මම එම විශේෂ තීරණය මගින් ඉතාමත් බරපතල ලෙස හානියකට පත් වූ පාර්ශවයක් විය. 7 පුද්ගල විනිසුරු මඩුල්ලක් විසින් 2002 ඔක්තෝබර් මසදී තීරණය කර තිබූ පරිදි, ව්‍යවස්ථානුකූලව බැහැර කළ නොහැකි වූ පරමාධිපත්‍යයේ ගැබ්වුන කොටසක් වශයෙන් වුන අධිකරණමය බලයේ පිළිසරණ පතා සිටින අතර තුරදී, එම බලය පාර්ලිමේන්තුවට පවරා ගත නොහැකි ය. මේ යථාර්ථ කරුණු මාගේ පෙත්සම් මගින් දක්වා ඇත.(*Google Books* – *'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'*)

කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමට අන්‍යොන්‍යව වංචා සිදුකිරීමේ හේතු සාධක මත, ජපාන සංධානයකට එරෙහිව කොළඹ දිසා අධිකරණයෙහි අංක 3155/විශේෂ දරණ නඩුව මම කලින් පවරනු ලැබ, එම වංචාව සාර්ථක ලෙසින් ඔප්පු කිරීමේ නියත හැකියාවක් මට ඇති බවට අංක 33 සහ 34/1992 දරණ ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනයන්හි ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, වෙනත් දේ අතර, ප්‍රකාශ කරවා ගැනීමට මම සමත්වීමි. ඒ අනුව හොටෙල් ඩිවෝලපර්ස් (ලංකා)PLC සමාගම වෙතින් හෝ රජය විසින් ප්‍රදානය කළ රාජ්‍ය ඇපකරයන් යටතේ ගෙවීම් සඳහා හිමිකම් පා සිටීමෙන් හෝ මුදල් ලබා ගැනීමෙන් ජපාන සංධානය වලක්වාලන ලදී. ඉන් අනතුරුව, එකී වංචාව පිළිබඳව විමර්ශණය කළ විශේෂ ජනාධිපති කොමිසම ඉදිරියේ සාපරාධිකරණය පිළිබඳ බිඳ හෙළිය නොහැකි සාක්ෂි මා විසින් ඔප්පු කරන ලද අතර, ජපන් ගෘහ නිර්මාණ ශිල්පීන් එය ප්‍රතික්ෂේප නොකරන ලද අතර, නාගරික සංවර්ධන අධිකාරිය විසින් එම වංචනිකත්වය පිළිගන්නා ලදී. (අමරසේකර -එදිරිව- මිට්යුයි ඇන්ඩ් කො ලිමිටඩ් සහ තවත් අය (1992) එල්ආර්සී (කොමින්).(*Amazon Books* – *'Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government – Vol. 1 – Sri Lanka's First Derivative Action in Law'* /*'Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government - Vol. 2 - Criminality Exposed, but Perversely Covered-up'*)

මාගේ එම නඩු ඉදිරියට ගෙන ගියෙහි නම්, නියත ලෙසින්ම ජය ලබා ගෙන හොටෙල් ඩිවර්ලොපර්ස් සමාගම, අද දින ශ්‍රී ලංකා රජයේ අයිතියට පත් නොවී, මට එහි ප්‍රධාන කොටස්කරුවෙක් ලෙස භුක්ති විදිමට තිබුණි. එසේ වුවත්, ජපන් රජයේ බලපෑම් හේතු කොට ගෙන, මා හා ශ්‍රී ලංකා රජය සමග එළඹුන කොන්ත්‍රාත්තු ගත ගිවිසුම්වල පදනම මත, මාගේ නඩු සමථයකට පත් කොට ඉල්ලා අස්කර ගන්නා ලෙස ශ්‍රී ලංකා රජය විසින් මාගෙන් ආයාචනාත්මකව ඉල්ලා සිටින ලද අතර, එම ගිවිසුම් වලට එකගවීමට මාගේ ප්‍රධාන සෘජු කොන්දේසියන් වශයෙන්, එම වංචාව නිසා, රාජ්‍ය ඇපකර යටතේ තිබුණු එම ජපාන ණය වංචනික හිමිකම් පෑම් වලින් එවකට ශ්‍රී ලංකා මුදලින් රු. මිලියන 10,200 ක් වුන ජපන් යෙන් මිලියන 17,586ක් 1995 ජුනි මසදී <u>කපා හැර</u> ගැනීමට මම සමත් වුයේමි. ඒ විදේශ ණය <u>කපා හැරීම</u> 2016 ජුනි මස වන විට ශ්‍රී ලංකා මුදලින් වටිනාකම<u> රු. බිලියන 89</u> ක් වු අතර, තවද කපා නොහැරි ඉතිරි විදේශ ණය මුදල 2016 ජුනි මස වන විට <u>රු. බිලියන 51.3</u> අඩු පොලී අනුපාතයකින් වසර 16 තුල, කොටස් වශයෙන් ගෙවීමට මා විසින් දිර්ඝ කර ගන්නා ලදී.(*Google Books* - *'Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government Vol. 3 - Settlement of a Fraud'* / *'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'*)

2014 සැප්තැම්බර් මස ජපන් අගමැති ශින්සෝ අබේ (Shinzo Abe) ලංකාවට පැමිණුනේ "ජපන් බිලියන 13 ක් ("ABE ARRIVES WITH YEN 13B LOAN"), (එනම් 2016 ජුනි මස වටිනාකමට ශ්‍රී ලංකා රු. බිලියන 15.5 ක) ණය මුදලක් සමග අබේ පැමිනේ" යන මහා උජාරු ලෙස දැක්වුන මාධ්‍ය ශිර්ෂ පාඨයන් සහිතව රැව් පිලිරැව් දීමත් සහිතවය. 2016 ජුනි මස අගයන් සංසන්දනාත්මකව ගණන් බැලු කල්හි මා විසින් ලබාගත් ඉහත කී ණය <u>කපා හැරීම</u> ජපන් අගමැති ශින්සෝ අබේ දෙන ලද ණය මුදලට වඩා පහමාර (5½) ක ගුණයකින් වැඩිය. තවද මම ලබා ගත්තේ සම්පූර්ණ <u>කපා හැරීමක් මිස</u>, ආපසු ගෙවිය යුතු <u>ණය මුදලක්</u> නොවේ.

තවද 2016 මැයි මස ජපනයේ සංචාර කළ ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන ජී 7 (G7) සමුළුව සදහා අරාධිත අමුත්තෙකු වශයෙන් සහභාගි විමෙදි, ජපන් අගමැති ෂින්සෝ අබේ (Shinzo Abe) විසින් ශ්‍රී ලංකා රජයට රු. බිලියන 50 ක් ආපසු ගෙවිමේ ණය මුදලක් ලබාදිම, ඉහත කි මා විසින් ලබාගත් <u>ණය කපා හැරීම</u> සමග සංසන්දනය කළ යුතුය.

සැකයට තුඩු දුන්, බේරුම්කරණ ගිවිසුම් වල සෙසු සියලු කොන්දේසි මත, ජපාන මුල්‍යායතන වෙත ඉදිරිපත් කළ ගෙවීම් කිරීමට අවසර දුන් 1999 මාර්තු මස අභියාචනාධිකරනයේ විනිසුරු C.V. විග්නේශ්වරන්ගේ බෙහෙවින්ම සැක සහිත වැරදි සහගත අතුරු නියෝගයක් නිසා, හොටෙල් ඩිවලෝපර්ස් (ලංකා)PLC සමාගම තවදුරටත් ප්‍රතිව්‍යුහගත කිරිම ඇතුලුව, මෙම නඩුව පසුව අවසානයේ මැයි 2014 නිශ්ප්‍රභා විය. - www.nihalsriameresekere-hiltonhotelcase.com

එහි ප්‍රතිඵලයක් ලෙස හොටෙල් ඩිවලෝපර්ස් (ලංකා)PLC සමාගම අවදානම් මුල්‍ය තත්වයකට ඇද වැටි සිටියදී, රජය විසින් රජයේ ඇපකර මත රු. මිලියන 3,959 ක් හෝටෙල් ඩිවලෝපර්ස් (ලංකා)PLC සමාගමට අත්තිකාරම් වශයෙන් ගෙවන ලදුව, එය මත, 2011 මැයි මස වන විට හෝටෙල් ඩිවලෝපර්ස් (ලංකා)PLC සමාගම රු. මිලියන 12,098 ක් රජයට ණය වි තිබුනි. 2011 නොවැම්බර් මසදී හදිසි පනත් කෙටුම්පත මගින් හෝටෙල් ඩිවලෝපර්ස් (ලංකා)PLC සමාගම ආණ්ඩුවට පවරා ගැනීම ඇතුලත්ව, ශ්‍රේෂ්ඨාධිකරණය මට සවන්දීමකින් තොරව, එමගින් රජය මගින් අයුතු ප්‍රතිලාභ හා වත්පොහොසත්කමක් උපයා ගැනීම සහිතව, මාහට පිරිමැසිය නොහැකි අනදරයක් හා අප්‍රතිකාර පාඩු සහ අලාභ සිදුකර ඇති බැවින්, මට රජය විසින් වන්දි ගෙවීම යුක්ති සහගත තත්වයක් උද්ගත වුවේය. ඒ මන්ද යත්, මෙය මාගේ පුද්ගලික කටයුත්තක් වූ අතර, රජයට අවශ්‍ය වු පරිද්දෙන් සමථය සිදු කරන ලද්දේ කොන්ත්‍රාත්තු ගත ගිවිසුම් යටතෙහිය. මෙය මාගේ උත්සාහයන් සහ මට ගාස්තු දැරීමට සිදුවෙමින්, රජයට හා මහජනයාට අති මහත් එල ප්‍රයෝජනය ගෙන දුන්නාවු, මහජන අයිතීන් වෙනුවෙන් පමණුවනු ලැබු නඩු මෙන්, මහජන අයිතීන් වෙනුවෙන් වු නඩුවක් නොව මාගෙත්, සමාගමේ සහ එහි කොටස් හිමියන්ගෙත් අයිතීන් වෙනුවෙන් වුන පුද්ගලික නඩුකරයකි.

(*Amazon Books* - *'[Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government – Vol. 1 – Sri Lanka's First Derivative Action in Law]'* /*'[Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government - Vol. 2 - Criminality Exposed, but Perversely Covered-up]'*/*'[Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government Vol. 3 - Settlement of a Fraud]'* / *'[Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law]'*)




**2012 අගෝස්තු හා ඔක්තෝබර් මාසයන්හි කර ඇති ශිරානි බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණ අගවිනිසුරුවරියගේ මෙම විශේෂ තීරණයන් දෙකෙහි, විශේෂයෙන්ම පලාත් සභාවට අන්‍යොන්‍යව ඉඩම් විෂය පිළිබඳව අර්ථකථනය, ඇය 2011 ඔක්තෝබර් 24 දින කර ඇති ඉහත කී විශේෂ තීරණයේ අර්ථකථනයට මුලුමනින්ම හා හාත්පසින්ම ප්‍රතිවිරෝධී වේ. එම විශේෂ තීරණය දුන් ශ්‍රේෂ්ඨාධිකරණයේ එක් ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් වු ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය හා 2011 ඔක්තෝබර් 24 විශේෂ තීරණය සමාලෝචනය කිරීම වැලැක්වු එන්. පී. අමරතුංග විනිසුරුවරයා සහ කේ. ශ්‍රීපවන් විනිසුරුවරයාගෙන් සමන්විත විය. ඉහතකී විශේෂ තීරණ හාත්පසින්ම වෙනස්වීම ප්‍රශ්නයකි? මිට අමතරව, ඉහතකී කරුණු කාරණා හේතු මත, මෙම සිද්ධි හටගැනීමේ අනුපිළිවෙල අනුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ආන්දෝලනයට ලක්වුන කොටස් ගනුදෙනුවක් අඩංගු කිරීමේ අභිමුඛයෙහි, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියගේ ස්වාමි පුරුෂයාට මහජන උද්ඝෝෂණ දැඩිවු නිසා, එම බැංකුවේ සභාපති තනතුරෙන් 2012 මැයි මසදී ඉල්ලා අස්වීමට අනිවාර්යයෙන්ම සිදුවුනාට පසුව, වෙනත් පනත් කෙටුම්පතක් පිළිබඳව ඇය විසින්ම මුලසුන හෙබවු ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලක් විසින් 2012 අගෝස්තු හා ඔක්තෝබර් මාසයන්හි ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය විසින් කරන ලද්දා වු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි අර්ථකථනයන්ට ආනුශංගිකව, 2012 දී ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය දෝෂාභියෝගයකට ලක් කිරීමේ තැතට සහයෝගය දක්වනු පිණිස යුක්ති සහගතවු හේතු සාධක හරියාකාරව හා සත්‍යය ලෙසින්ම ස්ථාපිතවී ඇත.**

**2012 නොවැම්බර් 6 දින පාර්ලිමේන්තුවේ මුළු සාමාජික සංඛ්‍යාව වුන 225 දෙනාගෙන් සාමාජිකයින් 117 දෙනකු අත්සන් කළ ශිරානි බණ්ඩාරනායක ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුවරියට එරෙහිව නොයෙකුත් චෝදනා අඩංගු යෝජනාවක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ තබන ලදී. ඒ පිළිබඳව විමර්ශනය කොට වාර්තා කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධානයන් අනුව, 2012 නොවැම්බර් 13 දින ගරු කථානායකතුමා විසින් තේරීම් කමිටුවක් පත් කරන ලදුව, ඇය චෝදනා 3 කට වැරදිකාරිය කරමින්, එම වාර්තාව 2012 දෙසැම්බර් 8 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.**(*Google Books* – *'[Politics, Justice & the 'Rule of Law']'*)

**වෙනත් දේ අතර, ඉහතකී කරුණු කාරණා ගෙන හැර දක්වමින් ගරු කථානායකතුමා වෙත මම 2012 දෙසැම්බර් 5 දින දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ අතර, 2012 ඔක්තෝබර් 9 දින පාර්ලිමේන්තුවට ප්‍රකාශයට පත්කළ විධානය ඉටු නොකිරීම පෙන්වා දෙමින්, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියට එරෙහිව දෝෂාභියෝග ක්‍රියා පිළිවෙත හා සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරනු ලබන පෙත්සම් ඇසිමෙන්, ප්‍රසිද්ධියේ ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියට පක්ෂපාති වී ක්‍රියා කාරි වු ඉහතකී විනිසුරුවරුන් නුසුදුසු තත්වයකට පත් වි නොසිටින්නේදැයි යන ප්‍රශ්නය මත කරමින් ඊට අනුගාමිව 2013 ජනවාරි 5 දිනැතිව ලිපියක් යැවීම්.**

**මාගේ ඉහතකී 2012 ඔක්තෝබර් 18 දින අංක** SC(SD) **2/2011 හි පෙත්සම සහ ඒ සමග ලේඛණගත කළ සටහන් පාර්ලිමේන්තු තේරීම් කමිටු වාර්තාවේ 1437 පිටුවේ 1 තීරුවේ සදහන්ව ඇති පරිදි, 2012 දෙසැම්බර් 4 දින පාර්ලිමේන්තු කමිටුව විසින් ඉල්ලා යවා ඇති බව 2012 දෙසැම්බර් 8 දිනැති එම කමිටු වාර්තාවේ වාර්තා කොට ඇති බවත් හා ඉන් අනතුරුව, දිනකට පසු ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරිය හා ඇයගේ නීතිඥවරුන් එම වාර්තාවේ 1505 2 තීරුව අනුව, 2012 දෙසැම්බර් 6 දින පාර්ලිමේන්තු කමිටුව අභියස ක්‍රියා කටයුතු වලින් ඉවත් වී ඇත.**(*Amazon Books* – *'Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law'* / *'Politics, Justice & the 'Rule of Law'*)

**2013 ජනවාරි 10 සහ 11 දිනයන්හිදී පාර්ලිමේන්තුව විසින් ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියට එරෙහිවූ දෝෂාභියෝගය පාර්ලිමේන්තුව විසින් විවාදයට ගනු ලැබූ යෝජනා සම්මතයට පක්ෂව මන්ත්‍රීවරුන් 155 දෙනෙකු හා විපක්ෂව මන්ත්‍රීවරුන් 49 දෙනෙකු ඡන්දය දීමෙන්, මන්ත්‍රීවරුන් 20 දෙනෙකු ඡන්දය දීමෙන් වැලකි සිටීමෙන්, ඇයව ඉවත් කිරීමේ යෝජනාව සම්මත කර ගනු ලැබ ඇත. ආනුශංගිකව 2013 ජනවාරි 13 දින ඇයව ශ්‍රී ලංකාවේ අගවිනිසුරුවරියගේ තනතුරින් ඉවත් කිරීමේ බලපත්‍රය ශ්‍රී ලංකා ජනාධිපතිවරයා විසින් අත්සන් කරන ලද බව වාර්තා විය.**(*Google Books* – *'Politics, Justice & the 'Rule of Law'*)

**ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුවරියට එරෙහිව වුන දෝෂාභියෝග තැතට ප්‍රසිද්ධියේම සහයෝගය දැක්වීමේ සම්බන්ධතාවය කරණ කොට ගෙන, ශ්‍රැතිමාත්‍ර (**Hearsay**) මාධ්‍යකාර සහ ගොතන ලද ප්‍රචාර මත තතු නොදත් ජාත්‍යන්තර නියෝජිතායතන සහ සංගම් විසින් ප්‍රතික්‍රියා දක්වමින් අවහිරතා පමුනුවීම සහ විවේචනයන් එල්ල කිරීම පිළිබදව මම පුදුමයට පත්වුනෙමි. ඒ නිසාම මෙහි පහත දැක්වෙන අධිකරණමය ක්‍රියා චරියාවේ එක්සත් ජාතීන්ගේ බැංගලෝර් මූලධර්මයන්ගෙන් සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ලැටිමර් හවුස්හි මූලධර්මයන්ගෙන් මූලධර්මයන්, වෙනත් දේ අතර, උපුටා දක්වමින් අදාල යථාර්ත කරුණු දක්වමින් ලිපි ගණනාවක් මම පහත සදහන් පාර්ශවයන්ට යොමු කළෙමි.** (*Google Books* – *'Politics, Justice & the 'Rule of Law'*)

- **මානව හිමිකම් පිළිබද එක්සත් ජාතීන්ගේ කාර්යාලය**
- **එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව**
- **යුරෝපා සංගමය**
- **ජාත්‍යන්තර නීතිවේදි කවුන්සලය**
- **ජාත්‍යන්තර නීතිවේදි කොමිසම**
- **පොදු රාජ්‍ය මණ්ඩලීය මහලේකම්**
- **ජාත්‍යන්තර නීතිඥවරුන්ගේ සංගමයේ මානව හිමිකම් ආයතනය**
- **එංගලන්තයේ හා වේල්ස්හි නීතිඥවරුන්ගේ මානව හිමිකම් කමිටුව**
- **ඇමරිකානු නීතිඥවරුන්ගේ සංගමය**
- **පොදු රාජ්‍ය මණ්ඩලීය නීතිවේදීන්ගේ සංගමය**
- **පොදු රාජ්‍ය මණ්ඩලීය මහේස්ත්‍රාත්වරුන්ගේ හා විනිසුරුවරුන්ගේ සංගමය**
- **පොදු රාජ්‍ය මණ්ඩලීය නෛතික අධ්‍යාපන සංගමය**
- **කැනේඩියානු නීතිඥවරුන්ගේ සංගමය**
- **ඕස්ට්‍රේලියානු නීති කවුන්සලය**
- **සමස්ථ ඉන්දියානු නීතිඥවරුන්ගේ සංගමය**
- **ආසියානු මානව හිමිකම් කොමිසම**
- **ආසියානු නෛතික සම්පත් මධ්‍යස්ථානය**

උත්ප්‍රාසාත්මක ලෙස, ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2011 අප්‍රේල් 8 වන දින නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ 2010 මානව හිමිකම් පිළිබද වාර්තාවෙහි, අංක 25 සහ 26 පිටුවල අනෙකුත් කරුණු අතරතුර, 4 වන ඡේදයෙහි "රාජ්‍ය දූෂණ සහ රජයේ විනිවිදභාවය" ලෙස ශීර්ෂගත කරුණෙහි පහත පරිදි සදහන් වේ.

- “නීතිය මගින් රාජ්‍ය දූෂණ සඳහා අපරාධ දඬුවම් පහර සපයයි; කෙසේ වෙතත්, රජය නීතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කර නොමැති අතර, රජයේ අංශයන් තුනෙහිම නිලධාරීන් දඬුවම් ලැබීමකින් තොරව දූෂණ ක්‍රියාවන්හි යෙදී ඇත.”

- “කොළඹ වරාය පුළුල් කිරීම සඳහා විශාල කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී, එවකට භාණ්ඩාගාර ලේකම් පී. බී. ජයසුන්දර විසින් නියමිත පටිපාටි උල්ලංඝනය කර කටයුතු කළ බවට 2008 වර්ෂයේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තහවුරු කර ස්ථාපනය කරන ලදී. අධිකරණය විසින් ඔහුට භාණ්ඩාගාරයේ තනතුරු දැරීම තහනම් කරන ලදී. 2009 ජූනි මාසයේදී, ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් නව අග්‍රවිනිශ්චයකාරවරයකු නම් කිරීමෙන් අනතුරුව, පී. බී. ජයසුන්දරහට මුල් තීරණයට විරෝධතාවය දක්වමින් මූලික අයිතිවාසිකම් නඩුවක් ඉදිරියට ගෙන යාම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවසර ලබා දෙන ලදී. පසුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පූර්වයෙන් ලබා දුන් තීරණය උඩුයටිකුරු කරමින් පී. බී. ජයසුන්දර භාණ්ඩාගාරයේ ලේකම් ලෙස නැවත සේවයේ පිහිටුවීමට අවසර ලබා දුනි.”

ඉහතින් සඳහන් වන රජයේ අංශ තුනෙන් එකක් අධිකරණය වන අතර අනෙක් අංශයන් වන්නේ විධායකය සහ ව්‍යවස්ථාදායකයයි. උත්තරිතර අධිකරණය වූ ශ්‍රේෂ්ඨාධිකරණයේ එවකට ජ්‍යෙෂ්ඨතම විනිසුරු ආචාර්ය ශිරාණි බණ්ඩාරනායක විය. 2011 මැයි 18 වන දින එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාව නිකුත් වීමත් සමගම, ඇය ශ්‍රී ලංකාවේ අග්‍රවිනිශ්චයකාර ලෙස පත් කර තිබුණි.

**ඉහත කී පරිදි, මම වහාම 2013 ජනවාරි 3 දින එංගලන්තයේ සහ වේල්ස්හී නීතිඥ මණ්ඩල මානව හිමිකම් කමිටුව වෙත ඔවුන් විසින් 2013 ජනවාරි 2 දින නිදහස් කර ඇති ප්‍රකාශයක් පිළිබඳව එහි වැරදි මත පිළිබදව එළිදරව් කළෙමි. මගේ එම එළිදරව් කිරීම් පිළිබදව 2013 ජනවාරි 3 දිනැති විද්‍යුත් තැපැල් පණිවුඩය මගින් ඔවුන්ගේ ව්‍යාපෘති සම්බන්ධීකාරක ඉලාරි ඇරගන් විසින් මට ස්තුති කරමින්, මාගේ එම එළිදරව් කිරීම් ශ්‍රී ලංකාවේ තත්ත්වය නිරීක්ෂණය කරන ඔවුන්ගේ සහකරුවන් සමග බෙදා ගන්නා බව දන්වමින් කියා ඇත.**

**2013 ජනවාරි 3 දිනැති එළිදරව් කිරීම් නොතකා, 2013 පෙබරවාරි 27 දින ජියොෆ්රි රොබර්ට්සන් රැ.නී. විසින් ශ්‍රී ලංකාවේ අගවිනිසුරු දෝෂාභියෝගයට ලක්කිරීම පිළිබඳව වාර්තාවක් ඔහු විසින් එංගලන්තයේ සහ වේල්ස්හී නීතිඥ මණ්ඩල මානව හිමිකම් කමිටුව වෙත සකස් කර ඇති පරිදි, නිකුත් කර ඇති අතර, එය මාධ්‍යයන්හී ‘කීර්තිමත් එ.රා. නීතිවේදියා හිටපු අගවිනිසුරු ශිරාණී නිවැරදි බවට සොයා ගනියි’ යනුවෙන් ඉස්මතු කර දක්වා ‘රැජිනට ශ්‍රී ලංකාවේ පොදු රාජ්‍යමණ්ඩල රැස්වීමට සහභාගි නොවන ලෙසට ආයාචනා කර ඇත’ යනුවෙන්ද දක්වා ඇත. මම වහාම මාගේ 2013 මාර්තු 5 දිනැති ලිපිය ජියොෆ්රි රොබර්ට්සන් රැ.නී. වෙත යොමු කළෙමි.**

**ජියොෆ්රි රොබර්ට්සන් රැ.නී., ඔහු විසින් දැනුම ඇති හේතු මත, ඔහුගේ 2013 පෙබරවාරි 27 දිනැති වාර්තාවේ මාගේ එළිදරව් කරීම් ගැන සැල නොකර නිශ්ශබ්දව ඒ පිළිබඳව අදහස් පළ නොකළ අතර, මාගේ ඉහත කී 2013 මාර්තු 5 දිනැති ලිපියට ප්‍රතිචාර දැක්වීමද පැහැර හැරියේය. මාගේ විදේශීය සබඳතාවලින් මට දැනගැනීමට ලැබුනේ ජියොෆ්රි රොබර්ට්සන් රැ.නී. ව අන්තර්ජාලයේ ඔහුට ආරෝපනය කර ඇති ප්‍රකාශ මගින් එල්ටීටීය/ටීජීටීඊ විසින් වෘත්තීයමය වශයෙන් එම කාලයේදීම සේවයේ යොදවාගෙන ඇති බවත්, එම බරපතල කුතුකය ගැටීම් පිළිබඳව ඉහතකී ඔහුගේ වාර්තාවේ හෙළිකර නොමැති බවත්ය.**

**ඉන් අනතුරුව, මට දෙමළ ඊලම් අන්තර් ජාතික රජයේ අගමැති කාර්යාලයේ ලිපි ශීර්ෂයක් මත වෙනත් අය සමග ජියොෆ්රි රොබර්ට්සන් රැ.නී. අන්තර් ජාතික විනිසුරු යාන්ත්‍රණය නිරීක්ෂණය කිරීමේ මඩුල්ලට නම් කර ඇති 2015 නොවැම්බර් 17 දිනැති ලිපියක පිටපතක් මා වෙත ලැබී ඇත. මෙය පක්ෂපාතීත්වය සහ ඉහත කී ජියොෆ්රි රොබර්ට්සන් රැ.නී. ගේ 2013 පෙබරවාරි 27 දින වාර්තාවේ අවිශ්වාසයතාවය සහ අපකීර්තිදායක තත්ත්වය පිළිබඳ පැහැදිලිව දැක්වෙන අවස්ථාවක් නොවන්නේද?**

**Office of the Prime Minister**
**Transnational Government of Tamil Eelam**
**நாடு கடந்த தமிழீழ அரசாங்கம்**
**பிரதம அமைச்சர் அலுவலகம்**

875 Avenue of the Americas, Suite 906
New York, NY 10001, USA
www.tgte.org
pmo@tgte.org

November 17, 2015

## SRI LANKA - EXPERT PANEL NOMINATED TO MONITOR TRANSITIONAL JUSTICE MECHANISMS FROM VICTIMS' PERSPECTIVE



Geoffrey Robertson QC — Justice Shah — Marie Guiraud
Richard Rogers — Peter Haynes QC — Heather Ryan

***පරිවර්තනය***

### අධිකරණ චර්යා ධර්ම බැංගලෝර් මූලධර්ම

"විනිසුරු පක්ෂව, නැඹුරුව හෝ අගතියක් තොරව ඔහුගේ හෝ ඇයගේ හෝ අධිකරණ රාජකාරි ඉටු කළ යුතුය."

"විනිසුරු විධායක හා රාජ්‍ය ව්‍යවස්ථාදායක ශාඛා වෙතින් වන බලපෑම්, නුසුදුසු සම්බන්ධකම් වලින් නිදහස් වීම පමණක් නොව පමණක් නොව,ඒවායින් නිදහස් සාධාරණ නිරීක්ෂකයකු වෙත පෙනී සිටිය යුතුය."

"විනිසුරු කිසියම් හේතුවක් නිසා, ඕනෑම කාර්තුවක හෝ සෘජු හෝ වක්‍ර, මැදිහත්වීමක්, සහන, බලපෑම, තර්ජන යනාදී ඕනෑම බාහිර බලපෑම් වලින් නිදහස්, නීතිය පිළිබඳ හෘදය සාක්ෂියට එකඟව අවබෝධය අනුව, කරුණු විනිශ්චයකාරයාණන් ඇගයීම පදනම මත අධිකරණ ක්‍රියාව ස්වාධීනව ක්‍රියාත්මක කළ යුතුය."

"අධිකරණ රාජකාරියේ දී, විනිශ්චයකාරවරයකු අධිකරණ සගයින්ගෙන් ස්වාධීන විය යුතු අතර, තීරණ සම්බන්ධයෙන් විනිසුරුට නිදහස්ව කටයුතු කිරීමට ඉඩ දීමට ඔවුන් බැඳී සිටී"

"අධිකරණය හා ඉන් පිටත යන දෙතැනදීම, විනිසුරු විසින් මහජන විශ්වාසය වඩාත් වැඩි වන පරිදි, ඔහුගේ හෝ ඇයගේ හැසිරීම සහතික කළ යුතු හා පවත්වාගෙන යා යුතුය...... "

ලැටිමර් හවුස් ප්‍රතිපත්ති

> "පිළිගත් මහජන වග වීම සහතික කිරීමේ මාධ්‍යයක් ලෙස, අධිකරණ කාර්ය සාධනය විවේචනයක්"

> "විනිසුරුවරුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ස්වාධීනව හා අඛණ්ඩතාව සමග, ඔවුන් අවංකව අයදුම් කළ යුතු වන නීතියට වග විය යුතුය..... විනිසුරුවරුන් නීති පැනවීම පිළිබඳ අර්ථ නිරූපණය නිර්මාණශීලී හා සාර්ථක විය හැකිය, නමුත් පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක කාර්යය පැහැර ගැනීම සිදු නොකල යුතුය."

> "දූෂණය ශුන්‍ය-ඉවසීමේ මෙම ප්‍රවර්ධන වැඩසටහන යහපාලනය කිරීම සඳහා ඉතා වැදගත් වේ."

**මම ඉතාමත්ම උනන්දුවෙන් යුතුව උදක්ම විශ්වාස කරනු ලබන්නේ යථෝක්ත ජාත්‍යන්තර ආයතන නියෝජිතයන් හා සමාගම් පූර්වෝක්ත යථාර්ථ කරුණු හේතු තත්වයන් හා සිද්ධින්වල අනුපිළිවෙල යථා පරිදි අවධාරණයට ගනිමින්, ශිරානි බණ්ඩාරනායක විනිසුරුවරිය සහ/හෝ ඉහතකී විනිසුරුවරුන්ගේ යමෙකු හෝ අධිකරණමය කල්ක්‍රියාව පිළිබඳ එක්සත් ජාතින්ගේ බැංගලෝර මූලධර්මයන් සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ලැටිමර් හවුස් මූලධර්මයන් අභිභවා, ඒවාට පටහැනිව ක්‍රියා කරනු ලැබ ඇතිදැයි හෝ නැතිදැයි යන්නත්, එම ආයතන නියෝජිතයන් හා සංගම් එම ක්‍රියා චරියාවන් හා ක්‍රියාවන් වරදක් ලෙස නොතකමින් අනුමත කරන්නේද නැතහොත් ඒවා හෙලා දකින්නේදැයි යන්නත්, පරික්ෂාකර බලනු කියාය. ජාත්‍යන්තර මාධ්‍යයෙහි ඉස්මතු කොට හුවා දක්වා තිබුන පරිද්දෙන් මෙම ජාත්‍යන්තර ආයතන නියෝජිතයන් හා සංගම් නොමග යැවෙන සුළු ලෙසට සහ විස්තීරණ ලෙසින් කටයුතු කර තිබුනාවූ තාක්දුරටම මහජන අයිතින් අරභයා එසේ කර සිටින ලෙසට ඔවුන්හට මම තරයේම අභියෝග කර සිටිමි.**

මූලාශ්‍රය - Consultants 21 Ltd. – [www.consultants21.com](http://www.consultants21.com)